Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ගැටුම් ව්‍යාවර්තනගත සංස්කෘතිය, බල අසමමිති සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ඩයනා ෆ්‍රැන්සිස් (Diana Francis)




1. හැඳින්වීම 116
2. සංස්කෘතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ බලය: සම්බන්ධතාව 117
   ආධිපත්‍ය සංස්කෘතිය 117
   ගැටුම් සහ එහි පැවැත්ම කෙරෙහි ආධිපත්‍ය රටාවන්ගේ බලපෑම 120
3. ගැටුම් ව්‍යාවර්තනය සඳහා වූ අනුමිති 122
   සංස්කෘතික ව්‍යාවර්තනය : නව යථාර්ථවාදීන්ගේ චෝදනාවලට ප්‍රතිචාර දැක්වීම 122
   බල අසමමිති සහ අසාධාරණත්වය ගැන සවිඥානක කිරීම 125
   සමානත්වයට ආධාර කිරීමේ උපායමාර්ගිකත්වය 130
4. යහ අභ්‍යාසය 133
   සංස්කෘතික සංවේදීතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය සහ සංවිධාන තුළ
   ගෞරවාන්විතව බලය යෙදවීම 133
   සංස්කෘතික සංවේදීතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය සහ මැදිහත්වීම්වලදී
   ගෞරවාන්විතව බලය යෙදවීම 134
5. පවතින ප්‍රශ්න සහ අභියෝගයන් 136
6. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම 138


©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ගැටුම් ව්‍යාවර්තනගත සංස්කෘතිය, බල අසමමිති සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ඩයනා ප්‍රැන්සිස් (Diana Francis)

## 1. හැඳින්වීම

එක පරිච්ඡේදයක් තුළ මෙම විෂය කරුණු තුන සඳහා යුක්තිය ඉටුකිරීම ඉමහත් අභියෝගයකි. ඒවා ඉතා සමීප ආකාරයෙන් සම්බන්ධ බැවින් එසේ කිරීමේ අර්ථයක් ද ඇත. වසර දහස් ගණනක් පැවතුණු, උවමනාවටත් වඩා කැපී පෙනෙන අන්දමට හුවා දක්වනු ලබන, ආධිපත්‍ය සංස්කෘතිය, පීඩනය සහ සූරාකෑම සඳහා ආකෘතියක් සහ සංස්කෘතික අනුදැන්මක් ලබාදෙන බවත්, එහි විදහා දක්වෙන ලක්ෂණ වන්නේ පීඩාකාරී පුරුෂ/ ස්ත්‍රී සම්බන්ධතා බවත් මම තර්ක කරමි. මෙම සංස්කෘතිය හා එහි අසමමිතික ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ නිමැවුම් සහ සම්බන්ධතා තුළින් ප්‍රකට වන දේ අභියෝගයට ලක් කිරීමේ අවශ්‍යතාව මා සම්බන්ධ කරන්නේ අවුරුදු පන්සියයක් තිස්සේ තිබුණා වූ යටත්විජිතවාදය මගින් නිර්මාණය කරන ලද තවත් ගෝලීය අසමමිතියක් ගැන ක්‍රියා කිරීමට ඇති අවශ්‍යතාවටයි. මෙම අසමමිතිය පවතින්නේ 'බටහිර සහ අවශේෂ ලෝකය' අතරය. මෙම ඉතිහාසය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ ව්‍යුහාත්මක සම්බන්ධතා අනුව සංස්කෘතික කරුණු පිළිබඳව ගෞරවාන්විත සහ අවංක සංවාදයක් ඇති කිරීම අතිශයින් අසීරු කරුණක් වී තිබේ. එයින් වැඩිදුරටත් පැහැදිලි වන්නේ බටහිරින් පරිබාහිරව ගැටුම් ව්‍යාවර්තනය දෙස බලන සැකමුසු ස්වභාවයයි. බලය පිළිබඳ ප්‍රශ්නය ගැන, ගෝලීය සම්බන්ධතාවලදී සාධාරණත්වයේ අවශ්‍යතාව සහ කාන්තාව සහ කොන් කරන ලද කණ්ඩායම්වලට සමාන වූ සැලකුම් ලැබීමේ අයිතියට ලැබිය යුතු අවධානය ලබා නොදෙන්නේ නම් ලෝකයේ ජනතාවගෙන් බොහෝ දෙනෙකු මෙය වැදගත් සේ නොසලකනවා ඇත. නැතහොත්, ඔවුන්ගේ පළපුරුද්දෙන් සහ විචක්ෂණ දැනුමෙන් එය පොහොසත් නොකරනු ඇත. ආධිපත්‍යය පිළිබඳ ප්‍රශ්නය ගැන ද කිසිවක් නොකරනු පමණක් නොව, එය පවත්වාගෙන යාමට උදව් කරන බවට තර්ක කළ හැක්කේ එමඟින් සාමකාමී වූ සම්බන්ධතා (එනම් සාධාරණත්වය) අව්‍යාජ අන්දමින් අත්පත් කරදීමට වඩා සමනය කිරීමේ මෙවලමක් ලෙස පමණක් වනු ඇත.

මුල් කොටසේ දී මා සාකච්ඡා කරන්නේ, සංස්කෘතිය, බලය සහ බල අසමමිතිය කෙරෙහි ආකල්ප, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ඒ පිළිබඳ සම්බන්ධතා ගොඩනැඟීම සහ ගැටුම සහ එහි පැවැත්ම අතර මෙම විෂයයන් තුනේම (සහ ඔවුන්ගේ අන්‍යෝන්‍ය බලපෑම්) බලපෑම් දක්වන සම්බන්ධතා ගැනයි. දෙවන කොටසේදී මා පරීක්ෂා කර බලන්නේ ගැටුම් ව්‍යාවර්තනය කෙරෙහි මෙයින් ගම්‍ය වන බලපෑම්, එහි ගැබ් වී තිබෙන අගයන් සහ පරමාදර්ශයන් අතර පවතින සමහර ආතතීන් සහ එයින් ව්‍යාවර්තනය කිරීමට බලාපොරොත්තු වන යථාර්ථයන් සහ අවස්ථා ගැනයි. පරිච්ඡේදයේ තුන්වන කොටසේ දී මගේ සැලකිල්ලට භාජනය වන්නේ සමානතාවයේ අවශ්‍යතා, සංස්කෘතික සංවේදීතාව සහ බලය සඳහා වන ධනාත්මක ප්‍රවේශ ගැටුම් ව්‍යාවර්තනය සඳහා දායකත්වයක් සැපයීමට බලාපොරොත්තු වන සංවිධාන තුළට බද්ධ කළ හැක්කේ කුමන ආකාරයකින් ද යන්න ගැනයි. ඒ සමගම ගැටුම් පිළිබඳව මැදිහත්වීම්

තුළ දී අනුගමනය කළ හැකි හොඳ අභ්‍යාසයන් සම්බන්ධ අංග කිහිපයක් ද යෝජනා කිරීමට බලාපොරොත්තු වෙමි. අප ඉදිරියේ තිබෙන්නා වූ අභියෝගයන්ගේ විශාලත්වය පිළිබඳ ආවර්ජනය කරමින් පරිච්ඡේදය අවසන් කිරීමට බලාපොරොත්තු වෙමින් යෝජනා කරන්නේ අප විසින් නීතිරීති තදින් ක්‍රියාත්මක කිරීම සහ විශ්ලේෂණය කෙරෙහි වඩාත් යාවත්කාලීන වූ ප්‍රවේශයක් එකතු කළ යුතු බවයි.

# 2. සංස්කෘතිය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ බලයඃ සම්බන්ධතාව

## 2.1 ආධිපත්‍ය සංස්කෘතිය

සංස්කෘතීන් නියත වූ හෝ ඒකසන ඒවා නොවේ; ඒවා ද්‍රවශීලී, සංකීර්ණ සහ පරිණාමය වනසුලුය. සංස්කෘතිය නිර්වචනය කිරීම ඉතාම අසීරු කරුණකි. මගේ විශාල ශබ්ද කෝෂයට කළ හැකි උපරිමය වන්නේ (අපට මෙහිදී අවශ්‍ය වන අර්ථය සඳහා) "අ) විශේෂ ස්වරූපයේ බුද්ධි වර්ධනයක්" යන්නයි. සංස්කෘතිය යන්නෙන් මා අදහස් කරන්නේ ජීවිතය පිළිබඳ උපකල්පන, එහි යථාර්ථ හා අවශ්‍යතා සහ නෛසර්ගික හෝ ඒ හා බැඳී පවතින සාරාර්ථයන් සහ ප්‍රතිමාන රටාවක් බවට පත්වීමක් වශයෙනි. සංස්කෘතිය යන සංකල්පය පවා සංස්කෘතික නිර්මිතයක් ලෙස කෙනෙකුට තර්ක කළ හැකිය. මේ අර්ථයෙන් ගත් කල, එය සාපේක්ෂ්‍ය වශයෙන් අලුත් මතයකි. එය අතිශයින් අපැහැදිලි සහ අවුල් සහිත අර්ථ-ශූන්‍ය තත්ත්වයට සමීප සංකල්පයක් යැයි ද තර්ක කළ හැකිය; එසේ වුවද නිර්වචනය කිරීමේ අපහසුතාව හේතුවෙන් එහි වැදගත්කම නිෂ්ප්‍රභ නොකළ හැකිය. එය මානව චින්තනය, ක්‍රියාකාරකම් හා සම්බන්ධකම් ආදියේ පදනම් පිළිබඳව කතා කිරීමට මඟක් සපයා දෙන බැවින් ද ඒ හා සමානවම දුෂ්කර සහ වැදගත් ප්‍රශ්නයක් වූ අනන්‍යතාවට ඉතා සමීප සම්බන්ධතාවක් පවත්නා හෙයින් ද එය අමතක කිරීමට හෝ ඉවත දැමීමට නොහැකි තරම් අතිශය වැදගත් දෙයක් වන්නේය.

සංස්කෘතිය යන සංකල්පය සමාජ සඳහා පමණක් නොව ඒ තුළ වෙසෙන පුද්ගලයන් සඳහා ද විචල්‍ය හා විශේෂිත වශයෙන් සැලකීමේ අවශ්‍යතාව පිළිබඳව රියානේ එයිස්ලර් (1999) ඒත්තු යන ආකාරයෙන් තර්ක කරන්නේ මෑත සහස්‍රකයේ සාමාන්‍යකරණය වූ සෑම ප්‍රධාන සංස්කෘතික ධාරාවක් හරහා ම දිවෙන හුය වන්නේ ආධිපත්‍යයේ කේන්ද්‍රීය අගයයිඃ එක් සත්ව විශේෂයක් අනික් සත්ව විශේෂ මත, එක් කණ්ඩායමක් අනික් කණ්ඩායම් මත, එක් පුද්ගලයෙකු අනිත් පුද්ගලයන් මත සහ එක් ලිංග ප්‍රභේදයක් අනික් ලිංග ප්‍රභේදය මත තබා ඇති ආධිපත්‍යයි. ඇය මෙය විස්තර කරන්නේ "ආධිපත්‍යයික සංස්කෘතිය" වශයෙනි. එයිස්ලර් දරණ මතය වන්නේ වෙනස් වූ උපකල්පන ඇතත් අවම වශයෙන් සමහර සමාජවල අතීතයේදී සාමානතා ප්‍රතිපත්තියට අනුකූලවන, සහයෝගී සම්බන්ධතා සම්මතය ලෙස සැලකුණු අතර, නැවතත් එසේ විය හැකි බවය. මේ අතරතුර ආධිපත්‍ය සංස්කෘතිය අතීතය හා වර්තමානය පිළිබඳ අපගේ මතය තුළ වඩා ඉස්මතු වී පෙනෙනු පමණක් නොව එම දෘෂ්ටිය අසහනකාරී අන්දමින් අනාගතයක් කරා ද විහිදී යයි.

ආධිපත්‍යයේ ඉලක්කය වන්නේ බල අසමමිතියයි. එය ඊට යටත්ව පවතී. එය නියෝජනය කරන්නේ වැඩිම ජනයා, වැඩිම සංස්කෘතීන් තුළ වඩාත් කැමැත්තෙන් බලය යන වචනය සඳහා හවුල්

කරගන්නා සම්බන්ධතාය; එනම්, යමක් කිරීමට ඇති හැකියාව හෝ අන්‍යයන් වෙනුවෙන් ක්‍රියා කිරීමට ඇති වගකීම යන්නට හාත්පසින් වෙනස් මිනිසුන් හා ද්‍රව්‍ය කෙරේ ආධිපත්‍යය යන අර්ථයයි (බෝල්ඩිං 1978). අන්‍යයන් මත බලය පාවිච්චි කළ හැකි විවිධ වාහක රාශියක් ඇත: ධනය; සම්පත් සහ වෙළඳ කොන්දේසි පාලනය කිරීම; භාෂාව; අධ්‍යාපනය; විලාසිතා; දේශපාලන සංයුති සහ භාවිතාවන්; නීති (ඒවායේ පැනවීම සහ උපයෝජනය); හමුදා ආඥාදායක්ක්‍රම හා යුද්ධ ද ඇතුළත් කෙබඳු ප්‍රමාණයක වූ හෝ සිරගත කිරීම සහ ශාරීරික ප්‍රචණ්ඩත්වය හෝ එවැනි තරවටු ආදිය මීට ඇතුළත්ය. ප්‍රචණ්ඩත්වය එනම්, අනික් අය මත හිංසාකාරී සහ විනාශකාරී අන්දමින් බලය යෙදවීම ආධිපත්‍යයේ උපක්‍රමය සහ ප්‍රතිඵලය යන දෙකම වන්නේය. ආධිපත්‍ය සංස්කෘතියක් යනු ප්‍රචණ්ඩකාරී සංස්කෘතියකි. යෝහාන් ගල්ටුංගේ වචනවලින් පවසන්නේ නම්, "සංස්කෘතික ප්‍රචණ්ඩත්වය, ඍජු හා ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය නිවැරදි හෝ එසේ හැඟී යන, නැතහොත් අවම වශයෙන් එය වැරදි නොවන දෙයක් හැටියට පෙන්වා දෙයි" (ගල්ටුං 1990, 291 පිටුව).

කාන්තා පීඩනය සංස්කෘතික වශයෙන් යුක්ති යුක්ත කෙරෙන අතර සාධාරණීකරණය ද කෙරේ. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ලිංගික වෙනස්කමේ සමාජයීය නිර්මාණයක් වශයෙන් පුම්තිරි භේදය අනුව නිර්වචනය කළ හැකිය (ප්‍රැන්සිස් 2000). සාම්ප්‍රදායික වශයෙන් නිර්මාණය කර ඇති පරිදි ස්ත්‍රී පුරුෂ භේදය ආධිපත්‍ය සංස්කෘතියේ අවශ්‍ය අංගයකි; එම භේදයට කේන්ද්‍රවන්නේ බල අසමමිතියයි. පුරුෂත්වය යනු බලවත්, ආක්‍රමණශීලී, පාලක ස්වරූපයක් ගත් නිර්මිතයකි; ස්ත්‍රීත්වය යනු පහත්, දුර්වල, යටහත්, කීකරු, සේවක හෝ (වඩාත් නිවැරදිව) අනුන් රැක බලා ගැනීම සඳහා වූ නිර්මිතියකි. මෙම නිර්මාණයේ වඩාත් සීමාන්තික මත අනුව කාන්තාවන් යනු පුරුෂයන් සතු දේපළක් වශයෙන් සැලකිය යුතු, ද්විතීයික සත්ව විශේෂයකි. කාන්තාව සිය කාලයෙන් වැඩිම කොටසක් දරුවන් සමග ගත කරමින් සිටින, ප්‍රධාන වශයෙන් දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන බැවින් පෙර කී සංස්කෘතික සංකල්පය පවත්වාගෙන යාම සඳහා ඇගේ ද සහභාගීත්වය ලැබෙන බව පැහැදිලිය. කාන්තාවන් අභිබවා පවත්නා වූ පුරුෂාධිපත්‍යය මානව සමාජයේ සහ සමාජවල අතිශයින් මූලික සහ පුළුල් ආකාරයෙන් පැතිරුණා වූ බල අසමමිති ස්වරූපයකි. ලෝකයේ සමහර තැන්වල පුරුෂයින් විසින් කාන්තාවන් පීඩනයට පත් කිරීම අඩුවෙමින් පවතී; තවත් තැන්වල එය අඩු නොවී පවතී. කෙසේ වුවද, බොහෝ (සියලුම නොවුවත්) සමාජවල කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පොදු සංසිද්ධියකි; බොහෝ සමාජවල කෙළින් ම නොවුවත් එය නිහඬව අනුමත වී ඇත. සමහර රටවල කාන්තා ව්‍යාපාර සහ ක්‍රියාකාරකම් සීමා කර ඇති අතර නීතිය යටතේ ඔවුන්ට සලකන ආකාරය සාහසිකය. එමෙන් ම අසාධාරණය. කාන්තාව ආර්ථික වශයෙන් ද පීඩනයට ලක් වෙයි. ඔවුන් කරන වැඩ ප්‍රමාණය සමස්තයක් වශයෙන් පිරිමින් කරන වැඩ ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි වුවද සාමාන්‍යයෙන් ගත් කල ඔවුන් සාමාන්‍යයෙන් උපයා ගන්නේ පිරිමින්ට වඩා බෙහෙවින් අඩු ප්‍රමාණයකි; ලෝකයේ ධනයෙන් ඔවුන් පාලනයට නතුවන්නේ බෙහෙවින් සුළු කොටසකි. බොහෝ විට උරුමයෙන් ලැබීම ඔවුන්ට අවහිර කර ඇත. ගෝලීය පදනමෙන් ගත් කල පුරුෂයන් සහ කාන්තාවන් අතර පැහැදිලි බල අසමමිතියක් තිබේ.

පසුගිය ශත වර්ෂ කිහිපය තුළ පැවතුණු යටත්විජිත ක්‍රියාකාරකම් හේතු කොට ගෙන තවත් ගෝලීය බල විකෘතිතාවක් ඉදිරියට පැමිණ ඇත; එනම් ජාතීන් සුළු ප්‍රමාණයක් අනික් ජාතීන් අභිබවා

පතුරුවන ආධිපත්‍යයයි (ඇලෙක්සැන්ඩර්, 1996, මෙහි සඳහන් කරන්නේ "ගෝලීය වර්ග-භේදවාදය" යනුවෙනි). පුළුල් ආකාරයෙන් ගතහොත්, මේ අනුව උතුර සහ බටහිර එක් අතකිනුත්, දකුණ සහ නැගෙනහිර අනික් අතිනුත් බෙදී තිබේ. එසේ වුවත්, ඇත්ත වශයෙන්ම යථා තත්ත්වය ඊට වඩා අතිශයින් සංකීර්ණ ය. ආධිපත්‍යය විවිධ ස්වරූප ගනී: එනම් මිලිටරි; ආර්ථික සහ සංස්කෘතික වශයෙනි. බටහිර සංස්කෘතික අධිරාජ්‍යවාදය එයට සම්බන්ධ වන එහි මිලිටරි සහ ආර්ථික බලය සමගින් එම ආධිපත්‍යයට සම්බන්ධ වී සිටින අය සහ එහි ආදීනව භුක්ති විඳින්නන් අතර ඇති වන ක්‍රියාකාරකම්වල ලක්ෂණ තීරණය කරයි. එය එක් පසෙකින් අනුග්‍රාහී සහ වර්ජනීය ආකල්ප - යටින් දිවෙන බිය සහ වෛරය (සයිද්, 1978) මෙන්ම අනෙක් පසින් සැකය සහ නුරුස්නා බව ද ඉස්මතු කරයි. මෙයින් ගම්‍ය වන්නේ වෙනස්කමක් ගැන ප්‍රකාශවල විශේෂයෙන්ම සංස්කෘතිය පිළිබඳ විෂයයෙහි දී සහ කැළඹිලිකාර තත්ත්වයක් හෝ අගෞරවණීය සහ ඒකාධිපති ස්වරූපයක් ගැනීමට ඉඩ තිබෙන බවයි. සංස්කෘතිය සහ අනන්‍යතාව අතර කිට්ටු සම්බන්ධතාවක් පවතින බැවින් ආධිපත්‍යයික සම්බන්ධතාවල දී සංස්කෘතික වෙනස්කම් තර්ජනයක් සේ සැලකේ.

අනන්‍යතාව ද සංස්කෘතිය මෙන් සංකීර්ණ බැවින් ආධිපත්‍යයේ අත්දැකීම් ද එසේමය. උදාහරණයක් ලෙස බටහිර කාන්තාවන් සහ ලෝකයේ වෙනත් රටවල පිරිමින් ගෝලීය මට්ටමෙන් ගත් කල අධිපතියන් සහ ආධිපත්‍යයට යටත් වන්නන් වශයෙන් කොටස් දෙකකි. තවද, ඕනෑම රටක් තුළ අසමාන සම්බන්ධතා තුළ විවිධ සමාජයීය සහ වාර්ගික කණ්ඩායම් සිටිනු නියතය. සියලුම පොහොසත් සහ බලවත් රටවල දුප්පත් සහ පර්යන්ත ජනකොටස් ඇත - ඒ ඊනියා 'හතරවන ලෝකයයි'. කිසියම් සමාජයක සංඛ්‍යාත්මක වශයෙන් සුළු ජන සංයුතියක් ඇති අනන්‍යතා කණ්ඩායම් සමහර විට සමස්තයක් වශයෙන් බහුතර කණ්ඩායමට වඩා දේශපාලන හෝ ආර්ථික වශයෙන් බලවත් වේ. සමහර අවස්ථාවලදී පීඩාවට ලක් වූ කණ්ඩායම් පීඩිත තත්ත්වය බල මූලාශ්‍රයක් වශයෙන්, අවශ්‍යතා ඉටු කර ගැනීමේ සදාචාරාත්මක බලයක් වශයෙන් සහ සහයෝගය ගොඩනැගීමේ කාර්යය සඳහා ද උපයෝගී කර ගනිති.



සියලු කණ්ඩායම්වලට අයත්, ඕනෑම ජීවන ක්ෂේත්‍රයක පුද්ගලයෝ බලය සඳහා තරග කරති. එමෙන් ම පුද්ගලයන් අතුරින් වැඩි දෙනා තමන්ගේ ජීවිත තුළ සමහර ක්ෂේත්‍රවල දී සාපේක්ෂ වශයෙන් බලවත්වීමටත් අනිකුත් ක්ෂේත්‍රවලදී සාපේක්ෂ වශයෙන් බල රහිත වීමටත් ඉඩ ඇත. ඒ ඇරත් සියලුම මනුෂ්‍යයන් වෙනස් වූ සන්දර්භයන්හි දී බලය සඳහා ආධිපත්‍යවාදී සහ සහයෝගතා ප්‍රවේශයන් ඉදිරිපත් කිරීමට ඉඩ තිබේ. පුරුෂයන් කාන්තාවන්ට වඩා ආක්‍රමණශීලී සහ පාලනමය නැඹුරුවකින් යුතුව උපන් කොටසක් යැයි යෝජනා කිරීමට හෝ එසේත් නැත්නම් බටහිර උපන් අය වෙනත් ප්‍රදේශවල උපන් අයට වඩා ආක්‍රමණශීලී සහ පාලනමය නැඹුරුවකින් අය ලෙස හෝ මම නොසලකමි. බොහෝ බලවත් සහ සූරාකෑමේ ගති පැවතුම් ඇති ස්ත්‍රීහුත් පුරුෂයෝත් උතුරේත් දකුණේත් සිටිති. මා තර්ක කරන්නේ සමස්ත ආධිපත්‍යයික සංස්කෘතියක් තුළ අනුග්‍රහය ලබන්නේ 'අභිබවා යන බලය' හෙවත් ආධිපත්‍යයික බල ආකෘතිය මිස ඊට ප්‍රතිපක්ෂ වන සහයෝගතාව පදනම් කරගත්, 'බලය සහිත' සහ 'බලය උදෙසා' වූ ආකෘතිය නොවේ. එම ඉහළින් කැපී පෙනෙන සංස්කෘතික සන්දර්භය තුළ ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට පැවරී ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අයත් කාර්යභාරයන්හි ප්‍රතිඵලය වන්නේ ඔවුන් අතර ඇති අධික බල අසමමිතිය වන අතර මෙය ව්‍යුහාත්මකව සහ චර්යා විධි යන දෙයාකාරයෙන්ම ප්‍රකාශයට පත් වේ. ඒ සමගම ආධිපත්‍ය සංස්කෘතිය විසින් පිහිට ලබන යටත්විජිතවාදයේ

ක්‍රියා හා ක්‍රියාවලි හේතුකොට ගෙන ලෝකයේ විවිධ කලාප අතර ව්‍යුහාත්මක බල අසමමිති හටගෙන තිබේ. මෙය ව්‍යුහාත්මක අසාධාරණත්වය සහ සංස්කෘතික අධිරාජ්‍යවාදයට ඉඩ සලසයි. මේ හේතු කොට ගෙන ඕනෑම දෙයක් පිළිබඳව විශේෂයෙන්ම සංස්කෘතිය ආශ්‍රිත දේ පිළිබඳව-සාකච්ඡා කිරීම සංවේදී සහ අසීරු කරුණක් බවට පත් වේ. පවතින භූ දේශපාලනමය බල අසමමිති සන්දර්භය තුළ කාන්තා විමුක්තිය බටහිර ව්‍යාපෘතියක් වශයෙන් පෙනී යන හෙයින් එය සංස්කෘතික අධිරාජ්‍යවාදය සමග සම්බන්ධ කොට දැක්වීමට ඉඩ තිබේ.

පුරුෂයින් හා කාන්තාවන් අතර සහ බටහිර හා ලෝකයේ අවශේෂය අතර පවතින පුළුල් හා සමස්ත බල අසමමිති මෙම පරිච්ඡේදයේ ප්‍රධානතම යොමුවීම බවට පත් වී ඇති නමුදු සංස්කෘතිය සහ පීඩාකාරී බල ව්‍යුහයන් සහ චර්යා අතර සම්බන්ධතාව විෂය ක්ෂේත්‍රයන් රාශියක දී අදාළ වන කාරණය වන්නේය (උදාහරණ වශයෙන් සේවාදායකයා/ සේවකයා අතර ඇති සම්බන්ධකම්වල දී, සංවිධාන තුළ දී, දේශපාලන පද්ධතිවලදී සහ වාර්ගික කණ්ඩායම් අතර).

## 2.2. ගැටුම සහ එහි පැවැත්ම කෙරෙහි ආධිපත්‍යයික රටාවන්ගේ බලපෑම

අදහස්, ක්‍රියාකාරකම්, ව්‍යුහ සහ ජනතාව එකිනෙකට සාපේක්ෂව වෙනස්වන සෑම අවස්ථාවක දීම ගැටුම අත්දැකීමට ඉඩ තිබේ. වෙනස්වීම නොවැළැක්විය හැකි දෙයක් පමණක් නොව, බොහෝ විට යෝග්‍ය ද වන හෙයින් ගැටුම ද නොවැළැක්විය හැකිය. පුළුල් අන්දමින් සඳහන් කරන විට එය සහයෝගයෙන් හෝ තරගකාරී ආකාරයෙන් හැසිරවිය හැකිය. ආධිපත්‍යයික සංස්කෘතියක් තුළ, අප දක ඇති පරිදි තෝරාගනු ලබන්නේ විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සම්බන්ධ තරගකාරී ආකෘතියයි. එවැනි සන්දර්භයක් තුළ ගැටුම හා සම්බන්ධ එදිරිවාදිකම් අපේක්ෂිත පරිදි සංස්කෘතික වෙනස්කම් මගින් උග්‍ර කරනු ලබයි. ආධිපත්‍යයික අභිප්‍රායයන් අන් අයට ආරෝපණය කරනු ලැබේ. එමෙන්ම 'අන්‍යතාව' තර්ජනයක් හැටියට සැලකේ. වෙනස්කම බල අසමමිති හා සම්බන්ධ වූ විටදී බලයේ සිටින අය කැරැල්ලක් ඇතිවීම බලාපොරොත්තු වීමේ හේතුවෙන් සහ ඊට පහළින් සිටින අය තර්ජනයට ගොදුරුවීමේ සහ පරිභවයට ලක්වීමේ හැඟීමක් ඇති කරගැනීමෙන් බිය සහ අවිශ්වාසය තවදුරටත් වැඩි කර ගැනීමට ඉඩ තිබේ. සංස්කෘතික වෙනස්කම ඒ අනුව වැඩිදියුණු වීමේ මූලාශ්‍රයක් නොව පරත්වාරෝපණයකි, වැරදි අවබෝධයකි, සාවද්‍ය අර්ථදැක්වීමකි. එය එක් අතකින් නොපිළිගැන්ම හෝ අගෞරවය සමඟත් අනික් අතින් රැවටිල්ල අමනාපය සහ අවඥාවට පාත්‍රවීම වැනි හැඟීම් සමඟත් බැඳී පවතී.

ආධිපත්‍යය පවත්වාගෙන යාමට හෝ ආධිපත්‍යයෙන් ගැලවී යාමට ඇති වුවමනාව සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වයට නිරන්තරයෙන් කෙරෙන පෙළඹවීමකි; එය පවතින බල ප්‍රදේශය තුළ පාලනය පවත්වාගෙන යාම හෝ බල ප්‍රදේශය පුළුල් කර ගැනීම විය හැකිය (මෙහිදී බලප්‍රදේශය යන්න වාච්‍යාර්ථ සහ රූපකාර්ථ යන දෙකම විය හැකිය). අයුක්තිය පිළිබඳ සැඟවුණු ගැටුම නොනවත්වා පවත්වාගෙන යනු ලබන්නේ සහ ප්‍රතිවාදී පක්ෂය යටපත් කරනු ලබන්නේ සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය සහ එයට සම්බන්ධ තර්ජනය මගිනි. අයුක්තිය හේතුකොට ගෙන පීඩා විඳින අයට හිතවැඩ සහිත වූ එකම විසඳුම වශයෙන් බොහෝ විට පෙනී යන්නේ සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වයයි. සුළු පරිමාණයේ බලයක් ඇති අය වඩාත් බලවත්වීම සඳහා ක්‍රියා කරන කල්හි ඔවුන් වෙත ගැටුම් ඇති කිරීමේ චෝදනාව එල්ල වේ (කිං 1963 බලන්න); සමස්ත වශයෙන්,

බොහෝ අවස්ථාවල දී, තමන්ගේ බල රහිත තත්ත්වයෙන් වාසි ලැබූ කොටස් ඔවුන් එම තත්ත්වයෙහි තබා ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වය හෝ පාලන ක්‍රම පාවිච්චි කරති . කාන්තාවන්ට පහර දෙනු ලැබේ; වහලුන්ට දඬුවම් කරනු ලැබේ; විප්ලවකරුවන්ට රජයේ හමුදා මගින් පහර දෙනු ලැබේ; කුඩා රාජ්‍යයන්ට බලවත් හමුදා මගින් සහ බලවත් රාජ්‍යයන්ගේ න්‍යෂ්ටික සංචිත මගින් පහරදීම හෝ තර්ජනය කිරීම් කරනු ලැබේ. මේ සියල්ල "සාමාන්‍ය" දේ හැටියට ආධිපත්‍ය සංස්කෘතිය සහ ප්‍රචණ්ඩත්වය මගින් පෙන්වා දෙනු ලැබේ.

ආධිපත්‍යයේ මූලාකෘතීය අභ්‍යාසය වන යුද්ධයේ දී පුරුෂාධිපත්‍යයික ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ කාර්යභාරය බෙහෙවින් අශික්ෂිත, කුරිරු ආකාරවලින් රඟ දක්වනු ලැබේ. ආධිපත්‍ය සංස්කෘතිය මගින් ප්‍රචණ්ඩ ගැටුම්වලට සහභාගීවීම වෙනුවෙන් පුරුෂයින්ට කීර්තිය, අනුමැතිය සහ සමාජ තත්ත්වය ලබා දෙයි. විශේෂයෙන් මෙය සිදුවන්නේ ප්‍රචණ්ඩත්වය සාමූහික අනන්‍යතාවක් සමග සම්බන්ධ වූ විටදීය. යුධකාමී ආධිපත්‍යයේ සංකේත මගින් ලෝකයේ නගර සහ මහ නගර අවලක්ෂණ කර ඇත. සුපුරුදු අන්දමින් එම සංකේත වන්නේ අශ්වයන් මත කඩු අමෝරා සිටින පුරුෂයන්ය. මෙම සංස්කෘතික දෘෂ්ටිකෝණය පරිදි කාන්තාවන් සලකනු ලබන්නේ සටන් කරන අයගේ මව්වරුන් සහ සහයෝගය දක්වන අය වශයෙන් පමණක් නොව එයට අමතරව පීඩාවට ලක්වන අය සහ සාමය ඇති කරන අය ද වශයෙනි. ස්ත්‍රී /පුරුෂ යන දෙවර්ගයම දූෂණය කිරීම යුද-චර්යා රටාවේ කොටසකි; එය ආධිපත්‍යය සහ මිනිසා කෲරත්වයට පත් කිරීම පිළිබඳ ලාංඡනයකි. විශේෂිත වූ කණ්ඩායමකට අයත්වීම හේතු කොට ගෙන කාන්තාවන් සාමූහික වශයෙන් දූෂණයට ලක් කිරීම අමුතු දෙයක් නොවේ. මෙයින් ඇඟවෙනුයේ පුරුෂ/ස්ත්‍රී ආධිපත්‍යය පමණක් නොව එක් පුරුෂ කණ්ඩායමක් අනික් කණ්ඩායම අභිබවා යාමක්ද වේ.



යුද්ධයේ දී කාන්තාවන් විඳින පීඩනය දුක් වේදනාවලින් කියැවෙන්නේ ඔවුන් විරුද්ධවාදීකම් සඳහා කිසියම් වැඩ කොටසක් ඉටු නොකරන බව නොවේ. කාන්තාවන්ගේ සාමය ඇති කිරීමේ කාර්යයන් පිළිබඳ උද්වේගාත්මක කතා ඇති නමුදු යුද්ධය සඳහා භූමිකාව සකස් කරන සමාජ ධ්‍රැවීකරණයෙහි ද කාන්තාවන් නිරතව සිටින අතරම යුද්ධ කිරීමට තම පුරුෂයන් ධෛර්යමත් කිරීමෙන් සහ පෙළඹවීමෙන් ද සමහරවිට තමන් ම සටන් කිරීමෙන් ම කරනු ලබන කාර්යභාරය පිළිබඳ කියවෙන වෙනත් කතා ද ඇත. ඒ අතරම කාන්තාවන්ට සාමය පවතින අවධියේ දී භුක්ති විඳිනවාට වඩා ගෘහස්ථ, ආර්ථික සහ සමාජ බලයක් යුද සමයේ දී ලැබේ. සිය සැමියන් යුද්ධයට සම්බන්ධ වී බැහැරට ගිය පසු කාන්තාවෝ බොහෝ විට පවුල් නඩත්තු කරන එකම අය බවට පත් වී ගෘහමූලිකත්වය දරති. පවුල් අවතැන් වූ විට ජීවත්වීම සඳහා අවශ්‍ය යමක් උපයා ගැනීමට හැකිවන්නේ බොහෝ විට කාන්තාවන්ටය. උදාහරණයක් වශයෙන් යම් යම් දේ නිපදවා අලෙවි කිරීමෙන් ඔවුහු මුදල් උපයා ගනිති (ඔවුන්ගේ පුරුෂ පක්ෂය මෙය නුරුස්සන්නට ඉඩ තිබේ; කොන් කිරීමේ හැඟීමක් ඔවුන් තුළ ඇති විය හැකි නමුත් ළමයින්ගේ අවශ්‍යතා හේතු කොට ගෙන මෙම බලපෑම ප්‍රතික්ෂේප නොකළ හැකිය). කාර්මික සමාජවල පෙර කාන්තාවන්ට වැසී තිබූ රැකියාවලට කාන්තාවන් බඳවා ගැනීම සිදුවිය හැකිය; තවත් අවස්ථාවල දී බලහත්කාරයෙන් ගෘහ සේවයට යොමු කෙරෙනවා ඇත (රෙයිමාන් 1999). මේ අතරම යුද්ධ කරන අයට අභියෝග කිරීමේ දී සහ යුද්ධය අවසන් කිරීම සඳහා දරන ලද ප්‍රයත්නවල දී කාන්තාවන්ගේ සහභාගීත්වය පිළිබඳව ගිනිය නොහැකි තරම් උදාහරණ ඇත; අවතැන් වූ අය ගැන සොයා බැලීම පිළිබඳව ද එසේම ය. (තම ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ ආකෘතියෙන් වෙනස් වෙමින් පුරුෂයින්ට වුවද එම ක්‍රියාදාමය තෝරාගත හැකිය: එනම් යුද්ධයට බඳවා ගැනීමෙන් වැළකීම හෝ එයට විරෝධය පෑම,

සාම ව්‍යාපාරයට බැඳීම හෝ පීඩනයට ගොදුරු වූ අයට උදව් කිරීමයි.) කෙසේ වුවද යුද ගැටුම් පවත්වාගෙන යන්නේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සඳහා නොව වෙනත් ඉලක්ක සඳහා වන බැවින් ගැටුම් අවසන් වූ පසු කාන්තාවන්ට සාම්ප්‍රදායික වශයෙන් සමාජයේ අත්විය යුතු තැන තීරණය කරන ලද අය නැවත වරක් ඒ ආකාරයෙන්ම කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා ඇත. ඒ අනුව යළිත් කාන්තාවන්ට තමන් අත්පත්කර ගෙන සිටි තත්ත්වය ආරක්ෂා කර ගැනීම අසීරු වනවා ඇත. ඔවුන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගෙන මුහුණපාන්නට සිදුවූ අපරාධ සම්බන්ධයෙන් සහන ලබාගැනීම ද පහසු නොවනු ඇත (විශේෂයෙන්ම ලිංගික අතවර). යුද්ධයෙන් පසු කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය උග්‍ර වෙයි. මෙය අනියම් ලිංගික සම්බන්ධතා තුළින් පළට වීම සාමාන්‍ය දෙයක් බවට පත් වී තිබේ (සමහරවිට ප්‍රධාන පෙළේ පාරිභෝගිකයන් වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය, OSCE සහ වෙනත් ජාත්‍යන්තර සංවිධානවල පුරුෂපක්ෂයේ කාර්ය මණ්ඩලයයි).

# 3. ගැටුම් ව්‍යාවර්තනය සඳහා අනුමිති

## 3.1 සංස්කෘති ව්‍යාවර්තනය : නව-යටත්විජිතවාදයේ චෝදනාවලට ප්‍රතිචාර දැක්වීම

ගැටුමක් සාධනීය ආකාරයෙන් කළමනාකරණය සඳහා අවශ්‍ය වන ප්‍රධානතම කාරණය ලෙස ක්ෂේත්‍රය තුළ පුළුල් වශයෙන් පිළිගෙන ඇති දෙයක් වන්නේ එයට පැටලී සිටින අයගේ මූලික මානුෂික අවශ්‍යතා තේරුම් ගැනීම සහ ඒ පිළිබඳව සොයා බැලීමයි (බර්ටන් 1990). මේවා අත්විඳින සහ ඒවාට මුහුණදෙන ආකාරය සංස්කෘතික වශයෙන් බලපෑම්වලට ලක්වනවා ඇත. මැක්ස්- නීෆ් (1985) තර්ක කරන්නේ, නිදර්ශනයක් වශයෙන්, අනන්‍යතාව පිළිබඳ අවශ්‍යතාවලට මුහුණ දීමේදී බටහිර සංස්කෘතීන් තුළ භෞතික ප්‍රතිලාභ වඩාත් කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන බවයි. අභිමානය විසින් වෙනත් ප්‍රමුඛතාවන් යෝජනා කරනු ලබන වෙනත් වූ සංස්කෘතීන් තුළ එම තත්ත්වය අඩු මට්ටමකින් පවතී (සාලෙම් 1993 බලන්න). ගැටුම් ව්‍යාවර්තනය හා සම්බන්ධ තිරස් සංස්කෘතික සංවර්ධනය සඳහා එම වෙනස්කම්වලින් හඟවන අභියෝග අභිබවා යා නොහැකි අන්දමින් නො පවතී. ඇත්ත වශයෙන්ම ඒවා ගැන අවධානය යොමු කිරීම බලාපොරොත්තු තබාගත හැකි සාධනීය ක්‍රියාවලියකි. ගැටුමේ ස්වභාවය පිළිබඳ අපගේ සමස්ත අවබෝධය සහ එයට ලැබෙන මානව ප්‍රතිචාර පරාසය තියුණු බවට පත් කිරීමට විභව ශක්තිය එයට තිබේ. කාන්තාවන්ට හඬක් නැගීමට වැඩිපුර අවකාශ ලැබෙන්නේ නම් ඒ හේතු කොට ගෙන ද සංස්කෘතික පරාසයක් කෙරෙහි බලපෑමක් සහ ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ අන්තර්ඥානයක් ලබාගැනීමට ඉඩ ඇත.

ගැටුමක් පිළිබඳව ක්‍රියා කිරීමේ ක්‍රමයක් වශයෙන් ගත් කල යුද්ධය මඟින් පැහැදිලිවම පෙන්නුම් කෙරෙන කරුණක් වන්නේ එයට හසු වී සිටින කාන්තාවන්ගේ, ළමුන්ගේ සහ වෙනත් සමාජයීය වශයෙන් කොන් කරන ලද හෝ පීඩනයට පත් කණ්ඩායම්වල අවශ්‍යතා ගැන අවධාරණය නොකරන බවයි. තවදුරටත් පැහැදිලිවන දෙයක් නම් එම තත්ත්වය සංස්කෘතික වශයෙන් පුළුල් ලෙස අනුමත වී ඇති බවයි. කෙසේ වුවද, සමහර සංස්කෘතීන් හැඩගස්වනවා පමණක් නොව අගයන් සහ ඒවා දරා සිටින අය මගින් හැඩ ගස්වනු ලැබෙයි. ඒවායේ වෙනස්කම් සහ විදහාපෑම් කාලය හා ස්ථානය ගත් කල අසීමිතය. ඒවා වෙනස් කරනු ලබන්නේ ඒවා සකස් කිරීමට උදව් කළ අය විසිනි. ඕනෑම සංස්කෘතියක අසීමිත වූ වෙනස්කම් ඇත; මේවායින් සමහරක් ප්‍රතිවිරෝධී සංස්කෘති වශයෙන්

විස්තර කළ හැකිය. මෙයට අමතරව ගැටුම් ව්‍යාවර්තනය ද ප්‍රතිරෝධී සංස්කෘතිකමය තත්ත්වයක් සේ දැකිය හැකි වන්නේ ප්‍රචණ්ඩ ගැටුමක ක්ෂණික විදහා දැක්වීම් ගැන මෙන්ම එහි ව්‍යුහාත්මක සහ ආකල්පනීය හේතු සහ දීර්ඝකාලීන වෙනස්කම් ගෙන ඒම පිළිබඳව අවධානය යොමු කිරීම හේතුවෙනි. එම යෙදුම භාවිත කරනුයේ වෙනසක් සඳහා ක්‍රියා කිරීම හා ක්‍රියානුරූප වූ න්‍යාය පද්ධතියක් ද ඊට අනුරූප වූ ක්‍රියා ද හඳුන්වනු සඳහා ය; එයින් විශේෂිත වූ අගයන් පදනම් කරගත් සමහර ඉලක්ක ද අදහස් කෙරෙයි. එය එක් පාර්ශවයක් අනික් පාර්ශවය මත ආධිපත්‍යය පැතිරවීමක් නොව ප්‍රචණ්ඩත්වයේ ආධිපත්‍යයික සහ ප්‍රචණ්ඩ සම්බන්ධතා මෙන්ම ව්‍යුහයන් සහ විදහා පෑම් ව්‍යාවර්තනය කිරීමකි. ඒ වෙනුවට ගැටුම් ව්‍යාවර්තනය ගත් කල ගැටුමක් පිළිබඳව ක්‍රියා කිරීමේ දී අරමුණු කරගන්නේ ගෞරවනීය සම්බන්ධතා, සහයෝගතා සහ අනුමැතිය යන සාධනීය ක්‍රියා මාර්ග මෙන්ම සම්මතයන්ය.

ගැටුම් නිවාරණය යන්න ලෙස සාරාංශ කොට දැක්විය හැකි ගැටුම් නිරාකරණ යන ක්ෂේත්‍රය වැනි බොහෝ කොට උතුරු ඇමෙරිකාවෙන් හෝ යුරෝපයෙන් මතු වී එන ක්ෂේත්‍ර ගැන බටහිරින් පරිබාහිර බොහෝ දෙනා - එනම් විද්වතුන්, දේශපාලනඥයන් සහ සමාජයීය වශයෙන් ක්‍රියාකාරී පුද්ගලයන් වැනි ලෝකයේ ජනගහනය තුළ සිටින අතිමහත් බහුතරය සැක පහළ කරති. ඔවුන්ගේ තර්ක මෙසේ සාරාංශ කළ හැකිය: "ඇත්ත වශයෙන්ම ඔවුන්ට ගැටුම් නැවැත්වීමට වුවමනාවක් තිබේ - ඒ ගැටුම් ඔවුන්ගේ නොව අපගේ ගැටුම් ය. ගැටුම් ස්ථාපිත තත්ත්වය අවුල් කරයි; එය ඔවුන්ට වාසි සහගතය. ඔවුන්ට විරුද්ධතා අවශ්‍ය නැත. සිය බලය අභියෝගයකට ලක්වීම ගැන ඔවුන් කැමැති නැත. බෝම්බ හෙළමින් තර්ජනය කරමින්, කුමක් කළ යුතු දැයි අනුන්ට පවසමින් ඔවුහු එහා මෙහා යති. එහෙත් නමුත් අප අපට අයත් ස්ථානයේ සිටිමින් සාමය පවත්වාගෙන යාම ඔවුන්ගේ වුවමනාවයි. යුක්තියෙන් තොර සාමයක් නැත. අපගේ ගෞරවය සහ අභිමානය තර්ජනයට ලක් වී ඇති කල සටන් කිරීමට අපි සූදානම්ව සිටිය යුතු වෙමු. සදාකාලිකවම අප එහෙ මෙහෙ තල්ලු කිරීමට ඉඩක් ලැබෙන්නේ නැත. නවතම අවමානය මෙයයි. විශාලතම යුදවාදීන් වන ඔවුහු ගැටුමක් පිළිබඳව අප ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි පවසති. කෙසේ වුවද, අප තේරුම් ගැනීමට තරම් ඔවුහු බුද්ධිමත් නොවෙති. ඔවුන්ගේ න්‍යායයට පදනම් වී ඇති සංස්කෘතික උපකල්පන අප වෙනුවෙන් අදාළ නොවේ. සමහරවිට අප ඔවුන් කරන කියන සියලු දේ අනුමත කරන බව ඉච්චාවට හෝ පෙන්විය යුතු වේ. එසේ කළ යුත්තේ මුදල් තිබෙන්නේ ඔවුන් සතුව බැවින් හා තීරණ ගනු ලබන්නේ ඔවුන් විසින් බැවිනි; ඔවුන්ට වඩාත් උචිත වන්නේ තමන්ගේ රටවල සිටිමින් ඒවායේ අවුල් විසඳාගෙන සිටීමයි. ලෝකයේ බොහෝ ව්‍යාධි කෙසේ හෝ අප වෙත එන්නේ ඒ රටවලිනි."



මෙය ඇත්ත වශයෙන්ම තර්කය රළු ආකාරයෙන් සරල කොට දැක්වීමකි (වඩාත් සැලකිලිමත්ව සහ සියුම් ආකාරයෙන් කරන ලද ප්‍රකාශන සඳහා සාලෙම් 1993 බලන්න); නමුත් එය යුක්ති සහගත කාරණයක් පිළිබඳ කරන ලද සාධාරණ සාමාන්‍යකරණයක් බව මම විශ්වාස කරමි. මෙය මේ ආකාරයෙන් හෝ වෙනත් ආකාරයකින් බොහෝ අවස්ථාවලදී ප්‍රකාශයට පත්වනු මා විසින් අසා ඇත. බටහිරින් පරිබාහිරව ගැටුම් ව්‍යාවර්තනය ප්‍රයෝජනවත් සහ අදාළ වන දෙයක් සේ වටහා ගෙන ඇත්නම් එහි අරමුණ ගැටුම් වැළැක්වීම නොවන බව පැහැදිලි කර ගැනීම අවශ්‍ය වේ. එය විය යුත්තේ සියලු ස්වරූපයන්ගෙන් යුත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ අවම කිරීමයි; එම ස්වරූප ඍජු, සංස්කෘතික සහ ව්‍යුහාත්මක වේ. සාමය අත්පත් කරගනු ලබන්නේ සාහසික වූ අසාධාරණත්වය සදාකල්හි පවත්වාගෙන

යාමේ බලාපොරොත්තුවෙන් නම් එවිට ගැටුම් නිරාකරණයක් සිදු නොවේය යන පණිවුඩය වඩාත් බලවත් සේ සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ. මෙය සියල්ලන්ගේ අවශ්‍යතා සහ අනන්‍යතා හඳුනාගන්නා වූත් ගරුත්වයට භාජනය කරන්නා වූත් ක්‍රියාවලියකි. ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ න්‍යායය යෝජනා කරන අය විසින් පිළිගැනීමට අවශ්‍ය කරුණක් වන්නේ බටහිර සහ අවශේෂ ලෝකය අතර වර්තමාන ප්‍රධාන ප්‍රවාහයේ කටයුතු ක්‍රියාත්මක වන ආකාරය ප්‍රතිපත්ති හා අභිලාෂයන්ට නොගැලපෙන බව යයි මම විශ්වාස කරමි. එමෙන්ම ඒවා වඩාත් යුක්ති සහගත ලෝක රටාවක් අපේක්ෂා කරන අය සමඟ සහයෝගයෙන් පැවතිය යුතු යයි ද විශ්වාස කරමි. මේවා කළහොත් බටහිරට වඩා ඔබ්බෙන් පිහිටි සංස්කෘතීන් තුළ ගැටුම් ව්‍යාවර්තනය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවකාශ නිර්මාණය කර ගැනීමට සමහරවිට හැකිවනු ඇත. ඒ හේතුකොට ගෙන විවිධ ස්වරූප සහ ප්‍රකාශන එයට දැකගත හැකි වේ. එය අන් අයගේ දැනුමෙන් සහ අත්දැකීම්වලින් පොහොසත් වනු ඇත. එය නියම ජාත්‍යන්තර හුවමාරුවකි.

ගැටුම්වල දී අර්ථදායී අයුරින් සම්බන්ධ වී සිටීමේ අවශ්‍යතාව ගෝලීය අසාධාරණකම්වලින් ද එමෙන්ම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණු සහ සමාජයේ කාන්තාවන්ට අත්වන ස්ථානය සහ ඔවුන් ගැන තකනු ලබන ආකාරය ඇතුළු විවිධ පීඩාකාරී, සම්බන්ධතාවලට අදාළව ද මෙම අවශ්‍යතාව පෙන්නුම් කරයි. මා විසින් මේ වන විටත් යෝජනා කර ඇති පරිදි මානව අයිතිවාසිකම් පිළිබඳ මතය සහ කාන්තාවන් සම්බන්ධයෙන් එය භාවිත කරන ආකාරය බටහිරින් ආරම්භ වූ සේ සැලකෙන බැවින් සමාජය තුළ ඔවුන් සිටිය යුතු ස්ථානය පිළිබඳ ප්‍රශ්න කිරීම එම සමාජයේ සංස්කෘතිය ගැන ප්‍රශ්න කිරීමක් ලෙස හැඟෙයි; මේ නිසා ස්ත්‍රීවාදී න්‍යායපත්‍ර අධිරාජ්‍යවාදීයයි හංවඩු ගසා පහසුවෙන් ඉවත දමනු ලැබේ. කාන්තාවන්ට එරෙහිව අගතීන් යුක්ත යුක්ත කරනු ලබන රටවල බොහෝ පුරුෂයින් සහ සමහර කාන්තාවන් විසින් එම අගතීන් සංස්කෘතියේ නාමයෙන් ආරක්ෂා කරනු ලබයි; එසේ කිරීමේ දී ඒ ගැන ප්‍රශ්න කරන අය සංස්කෘතික විරෝධී සහ අධිරාජ්‍යවාදය සමග දුස්සන්ධානයක් ඇති අය හැටියට චෝදනාවලට ලක් කරනු ලබති. කෙසේ වුවද සංස්කෘතික බලපෑම් සහ බල අසමමිති විවිධ ආකල්ප සහ චර්යා රටාවන් විස්තර කිරීමට උපයෝගී කරගත හැකි වුවත්, ඒවා යුක්ති යුක්ත නොකරනු ඇත. ව්‍යුහයන් සහ ක්‍රියාවන් මෙන්, සංස්කෘතීන් ඇගැයීමට, විවේචනයට සහ විපර්යාසයට විවෘතය. ප්‍රතිරෝධී සංස්කෘති ප්‍රධාන ප්‍රවාහය බවට පත්විය හැකිය. මා සංචාරය කළ සෑම තැන්හිදීම, තමන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සංස්කෘතියේ නාමයෙන් යුක්ති යුක්ත කළ විට කෝපාවිෂ්ට වූ මෙන්ම ධෛර්යමත් සහ අධිෂ්ඨානයෙන් යුතුව එයට එරෙහි වීමට ක්‍රියා කරන කාන්තාවන් මට හමු වී ඇත. එම ප්‍රචණ්ඩත්වය තුළ සුන්නත් කිරීම, ගමන් බිමන් සීමා කිරීම, උරුමය අහිමි කිරීම හෝ වැඩපොළේ දී හිරිහැර කිරීම ආදිය අන්තර්ගත වේ. මෙම පීඩනයට පාදක වී ඇති සංස්කෘතික පදනමට අභියෝග කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද ඔවුන්ට අවබෝධයක් ඇත. අවාසනාවකට මෙන් අතිශයින් පීඩාකාරී සමාජ වර්තමානයේ පවතින නමුත් ඒවා ගැන විවෘතව කතා කිරීම බිහිසුණු දඬුවම් කැඳවා ගැනීමක් වේ. මෙවැනි අවස්ථාවලදී ජාත්‍යන්තර පීඩනය යුක්තියුක්ත වනු පමණක් නොව අවශ්‍ය සේ ද පෙනී යයි. සහයෝගතාව සහ අධිරාජ්‍යවාදය අතර සංකල්පීය ව්‍යාකූලත්වයක් පවතිනු ඇත. එහෙත් ඒවා වෙන්කොට හඳුනාගත හැකි අතර එසේ ප්‍රභේදනය කිරීම අවශ්‍ය වේ. සංස්කෘතික වශයෙන් අනුමත කරන ලද අනිකුත් පීඩනකාරී ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් ද මෙය බලපායි; ඒවා කුල, වාර්ගික අනන්‍යතා, ලිංගිකත්වය හෝ කුසලතා ආදියට සම්බන්ධවීම ගැන විශේෂයක් නැත.

## 3.2 බල අසමමිති සහ අසාධාරණත්වය ගැන කටයුතු කිරීම

පීඩනය සැඟවුණු හෝ ප්‍රච්ඡන්න ගැටුම සේ සැලකිය හැකි යඃ එය ඇතිවීමට ආසන්න හෝ කරළියට ඒමට අපේක්ෂිත වූවකි (කිං 1963 සහ කර්ලි 1971). සිය බලය වර්ධනය කරගැනීම සහ පීඩනයට මුහුණදීම සඳහා කණ්ඩායම් තම තමන් සංවිධානය වන විට ඔවුන් ක්‍රියා කරන්නේ ආධිපත්‍යය පිළිබඳ ආකෘතිය තුළයි. ඒ එයින් ගැලවී යාම සඳහා ය. ඔවුන්ට අන්‍යෝන්‍ය සහයෝගිතාවයෙන් කටයුතු කළ හැකි අතර, තමන්ට උදව් කරන අය සමග ද සහයෝගයෙන් කටයුතු කළ හැකිය. එමෙන්ම තමන් පීඩනයට පත් කරන අය මත තම ආධිපත්‍යය පැතිරවීම ඔවුන්ට අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, පවතින සම්බන්ධතාව සහයෝගයෙන් කටයුතු කිරීමට අවසර නොදෙන බැවින් ඔවුන්ට තමන් පීඩනයට පත් කරන්නන් සමග සහයෝගීතාවක් ඇති කරගත නොහැකිය. ගැටුම් ව්‍යාවර්තන ආදර්ශය තුළ ඔවුන් විසින් අවිහිංසාවාදී (මෙහිලා non-violent හෙවත් 'හිංෂණාත්මක නොවන' සහ nonviolent 'අවිහිංසාවාදී' යන යෙදුම් අතර වෙනසක් ඇත. පළමු වැන්නෙන් උපාය මාර්ගයක් වශයෙන් හිංෂණය විරහිත ක්‍රියාමාර්ග ගැනීමත් දෙවැන්නෙන් දාර්ශනික මතයකුත් ගැනේ. මෙම ලිපියේ එය දෙවැනි අරුතින් ගැනේ.) මාර්ගවලින් තමන් පීඩනයට පත් කරන්නන් සිය බලයට නතු කර ගැනීමට කටයුතු කරනු ඇත. ගැටුම් නිරාකරණය පිළිබඳ සහයෝගිතා ක්‍රියාවලිය යථාර්ථවාදී විකල්පයක් වන්නේ ඔවුන් විසින් මෙය කළ පසු පමණි.

බල අසමමිති සහ ඒ හේතුවෙන් උද්ගතවන අසාධාරණකම් පිළිබඳ අවධානය යොමු කිරීම ගැටුම් ව්‍යාවර්තනයේ ප්‍රධාන සංරචකයක් නම් ගැටුම් වැළැක්වීම සහ අවසන් කිරීම සඳහාත් මැදිහත්වීම් සඳහාත් නිරන්තරයෙන් ම දෙනු ලබන ප්‍රමුඛත්වය සමානුපාතී නොවන සේ පෙනෙනු ඇත (මෙය ඵලදායක වන්නේ සාපේක්ෂ බල සමතාව තිබෙන විට පමණි). ගැටුම් වැළැක්වීම පිළිබඳ මතය ගැටුම් තුළ සහ ගැටුම හා අර්ථදායී ආකාරයෙන් කෙරෙන අවිහිංසාත්මක නිරතවීම් මතයට ඉඩ දිය යුතුය. මෙම ස්ථාවරය පරිදි අපක්ෂපාතීභාවය ඉබේ සිදුවන සහ එකම හොඳ දෙය නොවේ. පක්ෂපාතී භූමිකා අර්ථදායී විභව්‍යතාවෙන් යුත් මෙන්ම ගැටුමට සම්බන්ධ වූවන් නිරතවන අර්ථදායී ක්‍රියාවනට සහාය සඳහා මැදිහත්වීමේ මූලික ස්වරූපයක් (එය පක්ෂපාතී හෝ අපක්ෂපාතී වුවත්) සේ පෙනේ.

පළමුවන රූපය (ගුස් මෙයියර් සමඟ සංවර්ධනය කරන ලද) පෙන්නුම් කරන්නේ ප්‍රධාන බල අසමමිතියක් මගින් හුවා දක්වනු ලබන පීඩන අවස්ථාවක් හෝ සැඟවී තිබෙන්නා වූ ගැටලුවක් ව්‍යාවර්තනය කිරීමේ අවධි සහ ක්‍රියාවලීන්ය. ඕවලාකාර කොටුවල තිබෙන වචන මගින් ගැටුම් අදියර විස්තර කරනු ලබන අතර, ඍජුකෝණාස්‍ර කොටුවල තිබෙන වචනවලින් විස්තර කරනු ලබන්නේ එම අදියරවලට ළඟාවීම සඳහා උපයෝගී කරගත යුතු ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලීන්ය. ඊතල විවිධ දිසාවන්ට යොමු කර ඇත්තේ මෙම ක්‍රියාවලි අන්‍යෝන්‍ය ප්‍රතිෂ්ඨාකාරී වන බැවිනි. පීඩනයට ලක් වී ඇති අය තම පීඩනය සංජානනය කරන විට, බල සම්බන්ධතා වෙනස්වීමට පටන් ගනියි (මෙය පවුලෝ ප්‍රෙයිරේ (1992) සඳහන් කළේ "සංජානනීකරණය" යනුවෙනි); ඊට පසු ඔවුහු ක්‍රියාත්මක වීම සඳහා අන් අය ඇතුළුව සැදී ගනිති. මෙසේ සැදී ගැනීම සජ්ජිතවීමට අදාළ වන කටයුත්ත වන්නේ කණ්ඩායම් සහ ජාල සංවිධානය කිරීම, පොදු අගයන් සහ අරමුණු ඉස්මතු කොට දැක්වීම, පොදු උපාය මාර්ග සැලසුම් කිරීම (ගැටුම් ව්‍යාවර්තනය ඇතුළත, මෙය අවිහිංසාවාදී එකක් වනවා ඇත) සහ සියලු ආකාරයේ සහයෝගතා ගොඩනැගීම ආදියයි. ඔවුන් තමන්ගේ සාපේක්ෂා බලය වැඩිකර ගත් විට සහ තමන්ගේ පීඩකයන් කෙරෙහි වෙනසක් ඇති කිරීමට තරම් ප්‍රමාණවත් බලයක් අත්පත් කරගත්විට පමණක්

සාර්ථක අන්දමින් ඔවුන්ට මුහුණ දීමට හැකිවනු ඇත. එම මුහුණ දීම සමහරවිට පෞද්ගලික සංවාදයක, පොදු ක්‍රියාමාර්ගයක හෝ (බොහෝ විට) ඒ දෙකම විය හැකිය.

එම අවධියට ළඟා වූ විට, ගැටුමේ නිරාකරණ කොන්දේසි ගැන සිතීම යථාවාදී වන අතර තිත් ඉරිවලින් දක්වා ඇති සීමා තුළ ඇති ක්‍රියාවලි ආරම්භ කළ හැකිය. කෙසේ වුව ද, සිත්හි දරාගත යුතු කරුණක් වන්නේ කිසිදු අවධියකදී ප්‍රගතිය බාධා විරහිත නොවන බවයි. එමෙන්ම ගැටුම සුළු වශයෙන් තැකිය හැකි හෝ ඒකඝන දෙයක් නොවේ; මෙහි අවධි පවා කිසිවිටෙක එකිනෙකින් වෙනස් නොවේ. රූප සටහන පෙන්නුම් කරන්නේ ගැටුමේ අවුල් සහගත යථාර්ථය නොව දළ වශයෙන් අනුක්‍රමික වූ අරමුණු කට්ටලයකි. ගැටුම් නිරාකරණයේ ප්‍රතිඵලය හෝ අවසානය වශයෙන් දැකිය හැකි සමගිය යළි ස්ථාපනය කිරීම, බොහෝ විට ප්‍රායෝගික වශයෙන් සාක්ෂාත් කර ගැනීම කවදා හෝ සිදුවන්නේ නම් ඒ පරම්පරා ගණකට පසුවයි. කෙසේ වුවද පිළිගත හැකි අභිලාෂයක් වන එය ලබාගන්නේ/ ස්ථාවර කරගනු ලබන්නේ බොහෝ දුරට සමාජය නැවත ගොඩනැගීම සඳහා වන දීර්ඝකාලීන සහයෝගීතාව තුළිනි. මෙය පවත්වාගෙන යාම සඳහා යාන්ත්‍රණ සහ අර්ථදායී ගැටුම් කළමනාකරණ සංස්කෘතියක් අවශ්‍ය වේ; සමාජය තුළ බල අසමමිති කළමනාකරණය ගැටුම් කළමනාකරණයට ඇතුළත් වේ.

සැඟවී පවතින හෝ විවෘතව මුහුණට මුහුණලා කෙරෙන ගැටුමකට තමන් මැදි වී සිටින්නේ සිය කැමැත්තෙන් නොවන බව බොහෝ දෙනාගේ අත්දැකීමයි. සංකීර්ණ දේශපාලන අවස්ථාවල, නිශ්චිත දේශපාලන තීරණ හා ක්‍රියාකාරකම් තීරණ කරන්නේ පුළුල් කණ්ඩායමක් තුළ සිටින සාපේක්ෂ වශයෙන් සුළු පිරිසක් විසිනි; ඒ අතර ඉතිරි කොටස බල රහිත තත්ත්වයක සිටී. ගැටුම් ව්‍යාවර්තනයේ එක් අංගයක් වන්නේ දැනට බලය නොදරන අය උද්‍යෝගීමත් කිරීම සහ දැනුවත් කිරීමයි. එහි පරමාර්ථය වන්නේ ඔවුන් අර්ථදායී වෙනසක් සඳහා ක්‍රියාකාරී තත්ත්වයකට පත් කිරීමයි; ඵලදායී අන්දමින් ක්‍රියා කළ යුතු වේ නම් ඔවුන් ගැටුමට සාපේක්ෂව තමන්ගේ හැකියාවන් ගැන සලකා බැලීම අවශ්‍ය වේ: වෙනස් කළ යුතු දේ ගැන ඔවුන්ගේ අවබෝධය; ඔවුන්ගේ දැනට තිබෙන සම්බන්ධතා එසේ ඇත්නම්, විවිධ කණ්ඩායම් සහ පුද්ගලයන්ට සාපේක්ෂව ඔවුන්ගේ ස්ථාවරය; ඔවුන්ගේ පුද්ගලික කුසලතා සහ ධාරිතා; ඔවුන්ට සපයාගත හැකි ආධාරවල ස්වරූපයන් ගැන ද සලකා බැලිය යුතු වන්නේය. තමන්ගේ කණ්ඩායම් බල රහිත කරන ලද තත්ත්වය සිටින බව හා ගැටුම් නිරාකරණයක් ළඟා කර ගැනීමට පෙර තම තත්ත්වය ශක්තිමත් කරගැනීමට අවශ්‍යතාවක් පෙනේ නම් ඔවුන්ට පාක්ෂික භූමිකාවක් තෝරාගැනීමට ඉඩ තිබේ; එහි දී තමන්ගේම කණ්ඩායම් තුළ ශික්ෂකයන් වශයෙන් ක්‍රියා කරමින් සහ ඔවුන් අහිංසාවාදී කටයුතු සඳහා සූදානම් කළ හැකිය; අනෙකුත් බලය දරන්නන්ට සාපේක්ෂ වශයෙන් ඔවුන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන කාර්යභාරය භාරගත හැකිය (බල දරන අයගේ ගණයට ඇතුළත් වන්නේ පුළුල් මහජන සහ දේශපාලන විරුද්ධවාදීන්ය); ඔවුන්ට සංවිධාන බිහි කරන්නන්, මහජන ක්‍රියාකාරීන් සහ සහයෝගිතා ගොඩනඟන්නන් වශයෙන් ද ක්‍රියා කළ හැකිය; එහිදී අන් අයට සමීප වෙමින් සහ අනෙක් අය සම්බන්ධ කරගනිමින් සහ සංධාන ගොඩනගමින් ද කටයුතු කළ හැකිය.



උත්පත්තියෙන් සහ අන් අය විසින් පවරාදීම හේතු කොට ගෙන ගැටුමේ අභ්‍යන්තරයට සම්බන්ධ අය අතුරින් සමහරු ගැටුමට සම්බන්ධ වී සිටින පාර්ශ්වයන්ගෙන් කුමන පාර්ශ්වයට අයත් වුවත්, එකකට පක්ෂපාතී භූමිකාවක් රඟපානවාට වඩා සන්ධාන ගොඩනැගීමට අදිටන් කොටගෙන බල අසමමිතිය ගැන ක්‍රියා කිරීමේ කාර්යභාරය අන් අයට පවරති. ඒ වෙනුවට, ඔවුන් ප්‍රතිපක්ෂයේ

සුදුසු සාමාජිකයින් සමග සම්බන්ධතා ඇති කර ගැනීමට ක්‍රියා කරනු ඇත. තවද ඔවුන් සමග එක් වී මහජන ශික්ෂකයන් වශයෙන් කටයුතු කරමින් සහ ගැටුම් නිරාකරණය උදෙසා පසුබිම සකස් කිරීමට ද උදව් කරනවා ඇත.

අසමමිතික ගැටුමක මෙම අදියරේ දී පීඩනයට පත්ව ඇති කණ්ඩායමක් අවිහිංසාවාදීව බලවත් කිරීමට සහයෝගය ලබාදීම සඳහා බාහිර පුද්ගලයන් සම්බන්ධ විය හැකිය. එයින් බලාපොරොත්තු වන්නේ ගැටුමේ අන්තර්ගෘහිත නිරාකරණය ළඟා කරගත හැකි දෙයක් බවට පත් කිරීමයි (දැනට කණගාටුවීමට ඉතා පහසු දෙයක් වී ඇත්තේ අවුරුදු දහයක් පැරණි කොසෝවෝහි කොසොවාහි ඇල්බේනියානු ජනතාවගේ අවිහිංසාවාදී ක්‍රියාමාර්යට ජාත්‍යන්තර අවධානය සහ උදව් ඉතා අල්ප වශයෙන් ලැබීමයි). සංජානනීකරණයේ දී සහ ධාරිතා ගොඩනැගීමේ දී බාහිර පුද්ගලයන්ට අවශ්‍ය නම් උදව් කළ හැකිය. සම්පත් සපයා දීම ඔවුන්ට පිළිවන (මුදල්, තොරතුරු, විශේෂඥ දැනුම). ඔවුන්ට එරෙහිව යන අයට සාපේක්ෂාව සහයෝගය දෙන බවට බලාපොරොත්තු තැබිය හැකි අය වෙනුවෙන් පෙනී සිටින අය වශයෙන් ඔවුන්ට ක්‍රියා කළ හැකිය; එසේම ඔවුන් හා සාමුහිකව පොදු ජන කටයුතු ද කළ හැකිය. ගැටුම් නිරාකරණය තවමත් යථාර්ථවාදී විකල්පයක් නොවන බැවින් විවිධ පාර්ශව අතර මැදිහත්වීම් සඳහා කටයුතු කිරීම ප්‍රයෝජනවත් විය නොහැකි නමුත් බාහිර අයට සමගි සන්ධාන පිහිටුවීම සඳහා ඉදිරිපත් විය හැකිය. මෙහි දී ගැටුමට සම්බන්ධ පාර්ශවයන් අතර දැන හැඳුනුම්කම් සහ අන්‍යොන්‍ය අවබෝධතා ඇති කර ගැනීමට උදව් විය හැකිය (පෙර මැදිහත්වීම). ඔවුන්ට මානව හිමිකම් අධීක්ෂකයන්ගේ කාර්යභාරය ද ඉටු කළ හැකිය (එවැනි අවස්ථාවලදී මානව හිමිකම් උල්ලංඝනය කරනු ලබන්නේ දුර්වල පක්ෂයට සාපේක්ෂව ශක්තිමත් පක්ෂය විසින් නිසා අධීක්ෂණ කාර්යය බොහෝ විට පක්ෂපාතී අභ්‍යාසයක් සේ සැලකීමට ඉඩ තිබේ). පීඩාකාරී බල අසමමිතියට සම්බන්ධ පැහැදිලි ඒකපාක්ෂික අසාධාරණකම් සිදුවන අවස්ථාවල දී බාහිර අය හෝ තුන්වෙනි පාර්ශවකරුවන් පක්ෂපාතී භූමිකා තෝරාගැනීමට ඉඩ තිබේ. ඔවුන්ට අනාගත මැදිහත්කරුවන් වශයෙන් විශේෂිත වූ සුදුසුකම් තිබේ නම්, පසු අවධියකදී පහසුකම් සැලසීමේ භූමිකාව සඳහා ඉදිරිපත්වීමට ඉඩකඩ සලසා දීමට හා දෙපාර්ශවයට පිළිගත හැකිවන තත්ත්වයකට පත්වීමට මේ අවධියේ දී පසෙකට වී සිටීමට තීරණය කරනවා ඇත. අනෙක් අය නාමික වශයෙන් හෝ දෙපාර්ශවයම සමග ක්‍රියා කිරීමට තීරණය කරනවා ඇත; එහෙත් ඔවුන් ඵලදායී සාකච්ඡා සඳහා දුර්වල පාර්ශවයට තම ධාරිතාව වර්ධනය කර ගැනීමට උදව් කිරීමේ බලාපොරොත්තුවෙන් සිය ප්‍රයත්නයන් යොමු කරනු ඇත. 

බල රහිත කරන ලද කණ්ඩායම ගැටුම් නිරාකරණය සඵලවීම සඳහා ප්‍රමාණවත් ශක්තියක් ලබාගැනීමෙන් පසු, පක්ෂග්‍රාහී භූමිකා තෝරාගත් ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන්ගේ සාමාජික පිරිස් ගැටුම සඳහා අන්තර්ග්‍රාහී විසඳුමක් බලාපොරොත්තුවෙන් සිය පාර්ශවයේ අවශ්‍යතා සහ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් ලෙස ක්‍රියා කරනු ඇත. සබඳකම් පිහිටුවීමේ භූමිකා තෝරාගත් අය ඒවා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන්නේ, සෑම තලයකම සංවාදය ධෛර්යමත් කරමින් සහ තමන් ම සම්බන්ධවෙමින් ගැටුම සාමකාමී අන්දමින් නිරාකරණය කර ගැනීම වෙනුවෙන් කරුණු කියාපාන අය වශයෙන් පෙනී සිටිමින් සහ 'ව්‍යවස්ථාපිත කොට්ඨාස' ගොඩනැංවීමට උදව් කරමින් එම කටයුතුවල නිරත වී සිටිති. කුමන හේතුවක් නිසා හෝ මෙය කාන්තාවන් විසින් බාරගන්නා භූමිකාවකි; උදාහරණ වශයෙන් සියරා ලියෝන්හි සාමය සඳහා වූ කාන්තා ව්‍යාපාරය (පෙර පැවති කාන්තා සංසදය සමග

එක්වී සාදාගත්) ක්‍රියාකාරී සහ බලපෑම් කිරීමට තරම් ශක්තිමත් එකක් වීමත් රුසියානු යුද හමුදාවට අනිවාර්ය සේවා සොල්දාදුවන්ගේ මව්වරු චෙස්නියාවට එරෙහි විරුද්ධවාදිකම් නවතා දැමීමට බලකරමින් ඉතා ප්‍රසිද්ධියට ලක් වූ විරෝධතා ව්‍යාපාරයක් ගෙන යාමෙන් දැක්විය හැකිය.

මෙම අවධියට ළඟා වූ පසු තුන්වන පාර්ශ්ව සාමාන්‍ය වශයෙන් ප්‍රබලව කරුණු ඉදිරිපත් කිරීමට පෙනී සිටීමේ කාර්යය ගැටුම් පාර්ශ්වයන්ට ම පවරා සිය ප්‍රයත්න ව්‍යවස්ථාපිත සාම කොට්ඨාසවලට සහයෝගය දැක්වීම සහ ගැටුම් නිරාකරණ කාර්යයට සීමා කරනු ඇත. ඔවුන් මේ අවස්ථාවේ දී නිල නොවන දේශපාලන ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසීමේ මැදිහත්කරුවන් වශයෙන් ක්‍රියා කරනු ඇත. එම ක්‍රියාවලි අතර ප්‍රශ්න විසඳන වැඩමුළු සහ වෙනත් ආකාර වූ පූර්ව සාකච්ඡා (නිල සාකච්ඡා ගැන වුවත්) සහ බිම් තලයේ සහ ප්‍රාදේශීය තලයේ සංවාද ආදිය වෙයි (බල සාකච්ඡාවල දී තුන්වන පාර්ශවය විසින් කිසියම් 'සාකච්ඡා' ක්‍රියාවලියක් අනුගමනය කරන සේ බල කරනු පමණක් නොව එහි ප්‍රතිඵලය පවා පනවනු ලබයි - මේ අවධියේදී කටයුතු බොහෝ විට සිදුවන්නේ අර්ධ වශයෙන් මේ ආකාරයෙන් වුව ද එය ගැටුම් ව්‍යාවර්තන සංකල්පයේ කොටසක් නොවේ). සමථයකට ළඟා වූ පසු ස්ථානීය තලයේ දිගටම පවතින ආතතීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සහ අතීත මානසික කම්පන සහ අපරාධ ගැන කටයුතු කිරීම සඳහා තුන්වන පාර්ශවයේ පහසුකම් සැලසීම ප්‍රයෝජනවත් විය හැකිය. බාහිර නිරීක්ෂකයන්ට ද මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ සටන් විරාමයට එරෙහිව කටයුතු කෙරෙන කටයුතු විමර්ශනය වැනි භූමිකාවක් තිබෙන්නට පුළුවන.



ප්‍රචණ්ඩ ගැටුම් හේතු කොට ගෙන වධවේදනාවන්ට ගොදුරු වූ සමාජවල ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්ව දේශපාලන ක්‍රම (ප්‍රති) ස්ථාපිත කිරීම (අවශ්‍යයෙන්ම බටහිර ආකෘතිය අනුව නොවේ) සහ ගැටුම් අර්ථදායී ලෙස හැසිරවීම සඳහා වන සංස්කෘතියක් නිර්මාණය කිරීම, ව්‍යූහයන් සහ නිපුණතා නිරන්තරයෙන්ම කළමනාකරණය සාමය පවත්වා ගැන්ම සඳහා අත්‍යවශ්‍ය වේ. එමෙන්ම ගැටුම එදිනෙදා ජීවිතයෙහි අනිවාර්ය අංගයක් වන බැවින්, බල අසමමිති නිසා වන බැහැර කිරීම් සහ අසාධාරණකම් වෙනුවෙන් කටයුතු කළ යුතුය. මෙම ධාරිතාවන්ගේ සංවර්ධනය අනාගතයේ දී ඇති විය හැකි සංස්කෘතික, ව්‍යූහාත්මක හෝ ඍජු ප්‍රචණ්ඩ තත්ත්වයන් වැළැක්වීමට අත්‍යවශ්‍ය වේ.

මෙම සාමය ගොඩනැගීමේ අවධියේ දී, ගැටුමක අනෙක් සියලු අවධීවල මෙන් ම බටහිරින් ලැබෙන සහයෝගයට වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට හැකිවනු ඇත. එය පුහුණුව සහ උපදේශන සපයාදීමේ ආකාරයෙන් වන අතර, ඕනෑම තලයක සාධනීය පක්ෂපාතී කණ්ඩායම්, සබඳතා ගොඩනගන්නන්, මානව හිමිකම් සමීක්ෂකයන්, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ක්‍රියා කරන්නන් හෝ වෙනත් අය සඳහා විය හැකිය. එය කෙසේ වුවද ලබාදිය යුත්තේ යාවත්කාලීනව සහ සංවේදී ආකාරයෙනි; එහි දී දේශීය සංස්කෘතියට, සංජානනයන්ට, බුද්ධියට සහ යථාර්ථයන්ට සමීප අවධානයක් දිය යුතු වේ. මෙයින් වටහාගත යුත්තේ නම්‍යශීලී, සන්දර්භ විශේෂිත වූ සහ පුළුල් ආකාරයෙන් අනාවරණීය ප්‍රවේශයක් අවශ්‍ය බව වන අතර (ලෙඩෙරාච් 1995) මෙම ප්‍රවේශය ජොශාන් ලබාගත හැකි උපදේශ වට්ටෝරුවකට වඩා යහපත්ය.

### 3.3. සමානත්වයට ආධාර කිරීම පිළිබඳ උභතෝකෝටිකතා

ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලිවල කාන්තාවන් බෙහෙවින් ක්‍රියාශීලීවීම සාමාන්‍ය තත්ත්වයකි. කාන්තාවන් පමණක් සඳහා වූ කණ්ඩායම් වන ජාත්‍යන්තර 'විමෙන් ඉන් බ්ලැක්' කණ්ඩායම තුළ හෝ ස්ත්‍රී-පුරුෂ අන්තර්ගෘහිත සංවිධාන තුළ කොඳු නාරටිය වශයෙන් හෝ එම තත්ත්වය ක්‍රියාත්මක වේ: එහිදී, යුද්ධයට විරෝධය පෑමෙන් සහ සාමය ඉල්ලා සිටීමෙන්, විවිධ කණ්ඩායම් අතර සංවාද තත්ත්වයන් පෝෂණය කිරීමෙන්, මානව අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීමෙන්, සරණාගතයන්ට සහ යුද්ධයෙන් පීඩනයට පත් වෙනත් අයට ආධාර කිරීමෙන් හෝ සියලුම වයස්වල අය සඳහා සාම අධ්‍යාපනය වර්ධනය කිරීමෙන් කාන්තාවෝ කටයුතු කරති. ඒ හේතු කොට ගෙන ඔවුන්ගේ සමාජයීය සහ දේශපාලන ජීවිතයේ පූර්ණ කාර්යභාරයක් ඉටු කිරීමට උපකාරී කිරීම පිළිබඳ කාරණයේ දී සහ ඔවුන් විසින් ආමන්ත්‍රණය කිරීමට උදව් කරන දේශපාලන ගැටුම ව්‍යාවර්තනය කිරීමේ කාරණයේ දී කාන්තාවන්ගේ වැඩකටයුතුවලට සහයෝගය දැක්වීම ඵලදායී කටයුත්තක් වන්නේය. කෙසේ වුවද මේ වන විටත් සඳහන් කර ඇති පරිදි යුද්ධ පවත්වාගෙන යන්නේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නොවන බැවින් ද, යුද්ධ අවසන් කිරීම පිළිබඳ ගන්නා වූ මිලිටරි සහ දේශපාලන තීරණවල දී බොහෝ විට කාන්තාවන් සම්බන්ධ නොවන බැවින්ද, යුද්ධය අවසන් වූ විට දී කාන්තාවන්ගේ දායකත්වය සහ අයිතිවාසිකම් ආදී සියල්ල බොහෝ විට සැලකිල්ලට නොගනු ලැබේ.

සමහරවිට ගැටුම සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විසඳුම වන්නේ සුළුතර කණ්ඩායම්වලට වැඩිපුර ස්වාධීනත්වයක් ලබාදීම සහ තමන්ගේ සංස්කෘතියට සහ සම්ප්‍රදායන්ට අනුකූලව සිවිල් ජීවිතය සංවිධානය කර ගැනීමට නිදහස ලබාදීමටය. එනම් එම කණ්ඩායම තුළ තිබෙන බලවත් වූ සංස්කෘතික කණ්ඩායමේ විමුක්තිය වන අතර එය බොහෝ විට කාන්තාවනට පීඩාකාරී විය හැකිය (සාගල් සහ යුවල් ඩේවිස් 1992). අත්පත් කරගත් පසු ඒ සඳහා කාන්තාවන්ගේ දායකත්වය ලැබුණේ වී නමුත් කාන්තාවන්ගේ විමුක්තිය පිළිබඳ අවශ්‍යතාව නොසලකා හරිනු ලැබේ. නැතහොත් පුරුෂ නායකත්වය මගින් එය ලබාදෙනු නොලැබේ. ඒ අනුව කාන්තාවන්ගේ තත්ත්වය දියුණු වන්නේ නැත; නැතහොත් පෙරටත් වඩා නරක තත්ත්වයකට පත්වෙයි. වඩාත් පොදුවේ ගත් කල පශ්චාත් යුද අවස්ථාවලදී ගැටුමට සාමකාමී විසඳුමක් සෙවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළ අය හෝ යුද්ධයක් පවතින අවස්ථාවේදී නව කාර්යභාරයන් භාර ගැනීමට ඉදිරිපත් වූ අය පැහැදිලි සාමයක් අත්පත් කරගත් පසු පර්යන්තය කරා හරවා යවනු ලැබේ.

කොන්කරන ලද ජනවර්ගී දේශපාලන කණ්ඩායම් දිගින් දිගටම පර්යන්තයෙහි රැඳී සිටිති. මොවුන් අනුයුක්ත කර ගැනීමට හෝ දෙපැත්තේම ප්‍රහාරයන්ට මැදිවීමට ඉඩ ඇත. කිසියම් සමථයක් ලබාදීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී මේ අයගේ අවශ්‍යතා බොහෝ විට ඇතුළත් නොකරනු ලැබේ.

ප්‍රචණ්ඩත්වය සහ දුක් පීඩා තත්ත්වය උග්‍ර වූ විට හදිසි අවශ්‍යතා පිළිබඳ ක්‍රියාත්මකවීම් සහ මැදිහත්වීම් සම්බන්ධයෙන් යොමුවීමට බලවත් සදාචාරාත්මක පීඩනයක් පවතී. මේ හේතුකොට ගෙන පවතින්නා වූ සංස්කෘතික බාධක සහ බලය පිළිබඳ යථාර්ථයන් තුළ ක්‍රියාත්මක වීම සඳහා හැඩගැසීමට සිදුවේ. කාන්තාවන් පමණක් නොව ගැටුමේ ප්‍රධාන අක්ෂයෙන් බාහිරව සිටින්නා වූ සංස්කෘතික සුළුතරය බවට පත් වී ඇති පිරිස් (උදාහරණයක් වශයෙන් අග්නිදිග යුරෝපයේ රෝමා) ඉහළ තලයෙන්

බැහැර කොට ඇති අතරම ඔවුහු ද බොහෝ විට පැහැදිලි දේශපාලන සහභාගීත්වයෙන් ඈත් වී සිටිමින් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකයන් හැටියට පෙනී සිටීමට කැමැත්තක් නොදක්වති; මේ හේතුවෙන් එක් ප්‍රවණතාවක් අනික ශක්තිමත් කරයි. ප්‍රචණ්ඩ දේශපාලන ගැටුම සමථය කිරීමේ පරමාර්ථය ඇතිව වේගවත් ප්‍රගතියක් වෙනුවෙන් මැදිහත්වීමට කැමැත්ත දක්වන අය ඒ හේතුකොට ගෙන ප්‍රමුඛ පෙළේ ක්‍රියාකාරකයන් කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමේදී දුර්වල සුළුතර කණ්ඩායම් පර්‍යන්තය වෙත යාම තහවුරු කරයි. වෙනත් වචනවලින් කිවහොත් ගැටුම් ව්‍යාවර්තනයේ දීර්ඝකාලීන ඉලක්ක සහ අගයන් අතර අවිනිශ්චිතතාවක් පවතී. මෙහිලා සමාජමය වෙනස්වීම් සහ කෙටිකාලීනව ක්ෂණික දේශපාලන ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ ඉලක්කය ඇතුළත් වේ.

### කොටුව 01 : ජාත්‍යන්තර උද්ඝෝෂණ ව්‍යාපාරය වන "සාමය ගොඩනගන කාන්තාවෝ"

සාමය ගොඩනැගීමේදී කාන්තාවන්ගේ කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා බ්‍රිතාන්‍යයේ රාජ්‍ය නොවන සංවිධානයක් වන "ඉන්ටර්නැෂනල් ඇලර්ට් (IA) සාමය ගොඩනගන කාන්තාවෝ ගම් සභාවෙන් සාකච්ඡා මේසයට" නමින් යුත් ජාත්‍යන්තර උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කර ඇත. පහත සඳහන් ආයාචනය අත්සන් කොට බෙදා හරින මෙන් ඉල්ලා ඉන්ටර්නැෂනල් ඇලර්ට් (IA) සංවිධානය එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහ ලේකම් කොෆී අනන් මහතාට ලිපියක් යැවීය.

"ආදරණීය මහලේකම් කොෆී අනන් මහත්මයාණනි,

එක්සත් ජාතීන්ගේ මණ්ඩලය මගින් සාමය සඳහා ගන්නා ලද ප්‍රයත්නයන්ට ලොව පුරා සිටින කාන්තාවෝ ප්‍රශංසාව පළ කරති. එක්සත් ජාතීන්ගේ මණ්ඩලය තුළමත් සාමය ඇති කිරීමේ සහ සාමය ගොඩනැගීමේ ප්‍රයත්න සඳහා කාන්තාවන් ඇතුළත් කර ගැනීමේදී දක්වන ලද ප්‍රගතිය සහ 1995 දී එක්සත් ජාතීන්ගේ කාන්තාවන් සඳහා වූ ලෝක සම්මේලනයේ දී කාන්තාවන්ට දෙන ලද පොරොන්දු ගැන කාන්තාවෝ ප්‍රසාදය පළ කරති. කෙසේ වුවද අවුරුදු පහකට පසුව මෙම පොරොන්දු යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ප්‍රමාණවත් වැඩ කොටසක් කර නොමැති බව අපි විශ්වාස කරමු. තිරසර සාමයක් සාක්ෂාත් කරගත හැකි එකම මාර්ගය වන්නේ සමාජයේ සියලු තලයන්හි කාන්තාවන්ගේ පූර්ණ සහභාගීත්වයෙන් වන බැවින් ඒවා ක්‍රියාත්මක කළ යුතුය. ජාත්‍යන්තර ප්‍රජාව සම්බන්ධ ආණ්ඩුවලින් සහ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයෙන් අප ඉල්ලා සිටින්නේ දෙන ලද එම පොරොන්දු රකින ලෙසයි. ඒවා වන්නේ,

- සාම සාකච්ඡාවල දී තීරණ ගනු ලබන අය වශයෙන් කාන්තාවන් ඇතුළත් කිරීම
- ප්‍රතිනිර්මාණ කටයුතුවල දී සහ සාමය යළි ස්ථාපනය කිරීමේ දී කාන්තාවන්ට ප්‍රමුඛතාවක් ලබාදීම.
- සරණාගත සහ අවතැන් වූ කාන්තාවන්ගේ ආරක්ෂාව සහ නියෝජනය ශක්තිමත් කිරීම

- කාන්තාවන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වූ දඬුවම්වලින් නිදහස් කිරීම නැවැත්වීම සහ සහන තහවුරු කිරීම.
- සාමය ගොඩනැගීම සඳහා කාන්තාවන්ට සහ කාන්තා සංවිධානවලට අවශ්‍ය සහයෝගය සහ සම්පත් ලබාදීම.

"අවම වශයෙන් අත්සන් 250,000 එකතු කිරීමට සංවිධායකයෝ බලාපොරොත්තු වෙති. ලෝකය පුරා තිබෙන රාජ්‍ය නොවන සංවිධාන සියයකට අධික ප්‍රමාණයක් මෙම ව්‍යාපාරයට සහයෝගය දක්වයි. ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වූ සෑම තලයන්හිදීම සාම ක්‍රියාවලිවල කාන්තා සහභාගීත්වය ශක්තිමත් කිරීම සඳහා ද ගෝලීය ප්‍රතිපත්තිවල වෙනස්කම් ඇති කර ගැනීම සඳහා කටයුතු කිරීමට ද සංවිධායකයෝ බලාපොරොත්තු වෙති"

සාම ක්‍රියාවලි තුළ තිබෙන්නා වූ විශේෂිත වූ ස්වභාවය හේතු කොට ගෙන ද මැදිහත්වීම් සඳහා පුද්ගලයන් තෝරාගැනීමේ කාර්යයේ විවිධාකාර වූ අනුමිති තිබිය හැකිය. උදාහරණයක් වශයෙන් මා දන්නා කරුණක් නම් ශ්‍රී ලංකාවේ නිල නොවන දේශපාලන මැදිහත්වීම් සම්බන්ධ එක්තරා සංවිධානයක් අකමැත්තෙන් වුවද කාර්යයන්හි යෙදවීමට තෝරාගෙන ඇත්තේ පිරිමින්ගෙන් සමන්විත කණ්ඩායම්ය. එයට හේතුව ඔවුන්ගේ මූලික ඉලක්කය වී ඇත්තේ එහි දේශපාලන නායකත්වය තුළට ඇතුළුවීම සහ ඔවුන් සමග විශ්වාසය ගොඩනගා ගැනීමයි. ගැටුම් නිරාකරණය පිළිබඳ දීර්ඝකාලීන ඉලක්ක සහ පවතින බල ව්‍යූහයන් පාවිච්චි කිරීමේ කෙටිකාලීන යෝග්‍යතාව අතර තිබෙන මෙම අවිනිශ්චිතතාව දැනෙන්නේ කිසියම් නිශ්චිත සන්දර්භයක් තුළ ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරීන් විසින් ගනු ලබන තීරණාත්මක පියවරක් සඳහා ප්‍රත්‍යක්ෂ කරගන්නා ලද අවශ්‍යතාවකට අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පාවාදෙන විටදීය. උදාහරණයක් වශයෙන් සමථයක් කරා ළඟාවීමේ හදිසි අවශ්‍යතාව ගැන සලකන නායකයන් සාකච්ඡා ක්‍රියාවලියේදී තම ඡන්ද කොට්ඨාසවලින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු විමසන්නේ නැත. සාකච්ඡා සම්බන්ධයෙන් බොහෝ විට අතිශයින්ම අවශ්‍ය වන රහස්‍යභාවය විශ්වසනීයත්වය පවත්වාගැන්මට සහ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීමට එරෙහිව බලපායි. සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමට හෝ සමථකරණයක් අනුමත කිරීමට බලය පවරාගෙන තිබෙන අය වන්නේ බොහෝ විට තම බලය අනිසි ලෙස භාවිත කර ඇති අය වන අතර, ඔවුන් ඒ ආකාරයෙන් දිගටම කටයුතු කරනු ඇත. ප්‍රශ්නය එකක්ම වෙයි: දීර්ඝකාලීන සාමය ගොඩනැගීමේ තත්ත්වයක් ළඟා කර ගැනීම සඳහා පවතින බල සම්බන්ධතා මාර්ගයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය වන නමුත් ඒවා ද සාමය යන්නට ඊට වඩා හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ බල සම්බන්ධතා වෙයි. ප්‍රතිඵලය වන්නේ පර්යන්ත කණ්ඩායම්වල දීර්ඝකාලීන අවශ්‍යතා සහ අයිතිවාසිකම් කිසි දිනෙක ප්‍රමාණවත් අයුරින් සැලකිල්ලට ලක් නොවීමයි. ඔවුන් කෙරේ පවතින පීඩනය නියෝජනය කරන්නේ දැනට කෙරී ගෙන යන ගුප්ත ගැටුමේ ගැඹුරු, සැඟවුණු ස්ථරයකි.

'අවිගත් සාම සාධකයන්' හෝ 'සාමය බලගන්වන්නන්' යොදාගැනීම වෙනත් ආකාරයකින් එම උභතෝකෝටිකයම මතු කරයි. ආධිපත්‍යයික සහ බලකිරීම් ද වශයෙන් බලය යෙදවීමෙන් ඔවුහු යුද්ධවලදී පැන නගින යාන්ත්‍රණ සහ සම්බන්ධතාවල අඛණ්ඩ පැවැත්මක් ස්ථාපනය කරති; එසේ

වුවද, මොවුහු ඒවායින් ගැලවී යාම සඳහා ප්‍රායෝගික මාර්ගය ද බොහෝ විට පෙන්නුම් කරති. බල කිරීම පිළිබඳ විතැන්වීමක් ද මොවුන්ගේ ක්‍රියා කලාපය පෙන්නුම් කරයි. පරමාදර්ශී වශයෙන් ඔවුහු ආත්මාර්ථකාමී ආධිපත්‍යයේ මෙවලමක් නොවී, වඩාත් සමාන සහ සහයෝගී සම්බන්ධතා ඇති කිරීම සඳහා අවකාශ ලබාදීමට පුරුදුව සිටිති; එහෙත්, පරස්පරතාව එසේම පවතී. සාම සහ මානව හිමිකම් නිරීක්ෂණ සංවර්ධන එතරම් ප්‍රශ්නකාරී නොවන බැව් තර්ක කළ හැකිය. එමෙන්ම අවි රහිත සාම සාධනයෙහි යෙදීම පිළිබඳ අදහස ලොව පුරා බොහෝ කණ්ඩායම් මගින් වර්ධනය කරමින් හා මෙහෙයවමින් සිටී. ඒ කෙසේ වුවද එවැනි හමුදා හෝ කණ්ඩායම්වල සංයුතිය, ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය සහ වෙනත් අනන්‍යතා වශයෙන් ගෙන මිශ්‍ර කිරීම වැදගත්ය. එයට හේතුවන කරුණු දෙක වන්නේ හඟවන පණිවුඩය සහ එයින් ලැබෙන ධාරිතාවන්ය. මෙය බඳවාගනු ලබන අවස්ථාවේ දී සමාන අවස්ථා ලබාදීම සම්බන්ධ කාරණයක් ද වන්නේය.

ඉහත කී උභතෝකෝටිකයනට යටින් දිවෙන යුද්ධය සම්බන්ධයෙන් පවතින යථාර්ථයන් හා සංයෝගී වන සමානත්වය අන්තර්ගත බවට අදාළ අගයන් කිසියම් අනන්‍යතා කණ්ඩායමක අගයන් වෙයි. ඒවා සකස් කරනු ලබන්නේ ගැටුම් ව්‍යාවර්තනයට දැඩිව එල්බගත් අය විසින් සහ ඒවා ලැබෙන පුළුල් වූ ඇගයුම් කණ්ඩායම් මගිනි (ඒ සංස්කෘතික වශයෙන් ලිබරල්වාදී, දාර්ශනික වශයෙන් සමාන අයිතිවාසිකම් අගයන, දේශපාලන වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී, සමාජ ආර්ථික සාධාරණත්වය ගැන සැලකිලිමත් සහ යුද්ධට අකමැති කණ්ඩායම්ය). මෙම අගයන් කිසිම විශේෂිත වූ සංස්කෘතියකට සීමා කර නැත. එසේ ම කිසිවකට පොදු නොවේ; නමුත් ඒවාටම ආවේණික වූ සංස්කෘතියකින් යුක්ත වෙයි. ඒවා පොදුවේ පැතිර පවතින ඒවාටම ආවේණික වූ දීර්ඝකාලීන සහ කෙටිකාලීන න්‍යාය පත්‍රයක් ඇති ආධිපත්‍යයික සංස්කෘතියට පැහැදිලිවම එරෙහි වූ තත්ත්වයක පවතී. මෙම සංස්කෘතී ඉතා පැහැදිලිවම ලිංගික ප්‍රගතිය, ජාතිවාදය සහ සියලු ආකාරයේ අසාධාරණකම් කෙරෙහි විරෝධය පළ කරයි. මෙය අවංකවම පිළිගැනීම අවශ්‍ය වේ. ගෞරවනීය ආකාරයෙන්, ආධිපත්‍යය පාවිච්චි නොවන ආකාරයෙන් සහ තමන්ගේ ම න්‍යායයන් සහ අගයන්ට අනුකූලව සිය කටයුතු කරන මෙන් එය ගැටුම් ව්‍යාවර්තනය හා කටයුතු කරන අයට අභියෝග කරයි.

මගේ ලිපියේ ඉතිරි කොටසේදී ගැටුම්, ව්‍යාවර්තන කටයුතු ගෞරවනීය ලෙස සහ වගකීමකින් යුතුව කරන ආකාරය, වෙනත් වචනවලින් කියනවා නම් යහ-අභ්‍යාසය ගැනත් මම සලකා බලමි.

## 4. යහ අභ්‍යාසය (Good Practice)

### 4.1 සංස්කෘතික සංවේදීතාව, ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ සමානත්වය සහ සංවිධාන තුළ ගෞරවාන්විතව බලය යෙදවීම

ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ න්‍යාය සහ අභ්‍යාස ප්‍රවර්ධනය කිරීමට කැමැත්තක් දක්වන අය මුහුණපාන පළමු අභියෝගය වන්නේ ආධිපත්‍යයික නොවන්නා වූද, ගෞරවණීය සංස්කෘතියක්, ව්‍යුහයන් හා ක්‍රියාවලි වර්ධනය කිරීම සහ තම සංවිධාන තුළ ඒවා අනුගමනය කිරීම ද වෙයි. එම සංවිධාන මගින් දෙනු ලබන ආදර්ශය බහු ගුණාකාර බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබේ; කෙසේ වුවද, අවංකත්වය සඳහා එවැන්නක් අවශ්‍ය වේ:

- **සංවිධානය හා සම්බන්ධ සංස්කෘතිය තුළ ගෞරවය මූර්තිමත් කිරීම.**
  මෙය ප්‍රධාන කරුණකි. පාරදෘශ්‍ය වූ සංවිධානය හා සම්බන්ධ අගයන්ගේ පරාමිතිය තුළ, විවිධ සංස්කෘතික, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අනෙකුත් අනන්‍යතා සහ සුළුතර කොටස්වල අවශ්‍යතා සහ අයිතිවාසිකම් සඳහා දක්වන ගෞරවය ඇතුළත් විය යුතුය. සංවිධානයේ සාමූහික දර්ශනය තුළින් මෙම සංස්කෘතිය, එහි මෙහෙවර සහ ඉලක්ක හුවාදැක්වීම, එහි ප්‍රතිපත්ති, ප්‍රචාර සහ අන්තර්ගත ආකල්ප ප්‍රකාශ වනු ඇත.

- **සමාන අවස්ථා ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;**
  වැටුප් ලබන සහ ස්වේච්ඡා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ පාලක මණ්ඩලය තෝරාගැනීම සඳහා අවශ්‍ය වේ. එසේම සංවිධාන තුළ ප්‍රගතිය හා උසස්වීම් (සහ වැටුප්) සහ ආයතනයේ දර්ශනයට සහ සංස්කෘතියට දායකවීමට අවස්ථාවක් ලබාදීමට එය අවශ්‍ය වේ. ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධයෙන් ගත් කල මුහුණ දීමට සිදුවිය හැකි උභතෝකෝටිකය විය හැක්කේ දේශීය ගතානුගතික අදහස්වලට අභියෝග කරමින් දේශීය සන්දර්භය අනුව කාන්තාවනට අනුචිත යැයි හෝ අසාමාන්‍ය යැයි සිතන තනතුරුවලට කාන්තාවන් පත් කිරීම වැනි අවස්ථායි. එම තීරණයට එරෙහි පියවර වන්නේ ක්ෂණික ඉලක්ක ළඟා කර ගැනීමේ බාධක අවම කර ගැනීම සඳහා දේශීය සම්ප්‍රදායයන්ට හිස නැමීමයි. පසු විකල්පය තෝරාගන්නේ නම් එය සහ එයට හේතු, ඉවත් කරන ලද අය සමග සාකච්ඡා කොට පැහැදිලිව ප්‍රකාශයට පත් කළ යුතු වේ. අදාළ සංවිධානය විශේෂිත අනන්‍යතාවකින් යුතු කණ්ඩායමක් වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, එම කණ්ඩායමේ සාමාජිකයින් එහි ප්‍රධාන තනතුරු දැරීම යෝග්‍ය වේ; එහෙත් එය පැහැදිලිව සහ අවංකව හේතු දක්වමින් සන්නිවේදන කළ යුතුය. බලය සඳහා ප්‍රවේශය පිළිබඳ ප්‍රශ්නය සහ සංස්කෘතිය හා එයට ඈඳී තිබෙන වෙනත් අංග සහ අනන්‍යතාව (ස්ත්‍රී පුරුෂ සමාජභාවය, එය කාන්තා සංවිධානයක් නොවන්නේ නම්) තවදුරටත් අදාළ විය හැකිය.



- "බලය සමඟ සහ බලය සඳහා" වූ ප්‍රවේශය අන්තර්ගත කර ගන්නා සංවිධාන සම්බන්ධ ව්‍යුහයන් සහ අභ්‍යාස නිර්මාණය කිරීම සැලසුම් කරනු ලබන්නේ, ධූරාවලියට වඩා වගකීම සහ කෘත්‍යය පදනම් කරගෙනයි. ඒ සඳහා ඉගෙනීම සම්බන්ධ සහයෝගී ක්‍රියාවලි සහ තීරණ නිශ්චය කිරීම ඇතුළත් වේ. සහභාගික ක්‍රියාවලි සහ බලය හවුලේ භුක්ති විඳීම සඳහා ඉලක්ක සහ ක්‍රියා පටිපාටියේ සහ යථාර්ථයන් පිළිබඳ පාරදෘශ්‍යභාවය සහ පැහැදිලි බව අවශ්‍ය වේ. එය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම හා යොමු ලක්ෂයක් සපයාදීම සඳහා අභ්‍යාස මාලාවකින් ද සමන්විත විය යුතුය.

## 4.2 සංස්කෘතික සංවේදීතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය සහ මැදිහත්වීම්වල දී ගරුත්වයෙන් බලය යෙදවීම

ගැටුම් - මැදිහත්වීම යන යෙදුම සමහරවිට ඇති කරන හැඟීම වන්නේ සිද්ධියට මැදිහත්වන ක්‍රියාකාරීන් ගැටුමට පරිබාහිර ප්‍රදේශයකින් පැමිණෙන අය වීමයි. ගැටුම් ව්‍යාවර්තනය සහ ගරුත්වයෙන් බලය යෙදවීම සම්බන්ධයෙන් පළමුවෙන්ම අවධානයට ලක් කළ යුතු ප්‍රශ්නය වන්නේ මෙයයි. ගැටුම් ව්‍යාවර්තනයේ දී මූලික ක්‍රියාකාරකයන් වන්නෝ කවරහුද? මා තර්ක කරන්නේ, සදාචාරාත්මක සහ ප්‍රායෝගික යන දෙයාකාරයෙන්ම ගත් කල, ඒ අය ගැටුම හේතුවෙන් වඩාත්

ඍජුව බලපෑමට ලක් වූ අයයි. අභ්‍යන්තර ක්‍රියාකාරීන්ට හෝ බැහැරින් පැමිණ මැදිහත්වන අයට හෝ ඒ දෙපාර්ශවයටම අයත් අය විසින් උපයෝගී කොටගත හැකි යහපත් අභ්‍යාස වශයෙන් මෙහි එන යෝජනා සකස් කොට ඉදිරිපත් කරමි. කෙසේ වුවද, සමහර යෝජනා පැහැදිලිව බාහිර අය සඳහා ඉලක්ක කර ඇත.

- **සංස්කෘතිය පිළිබඳ ගැටලුවලට පැහැදිලි අවධානය යොමු කිරීම:** ප්‍රාරම්භක පර්යේෂණ සහ ව්‍යාපෘති / වැඩසටහන් සැලසුම් කිරීමේ දී තිබිය යුතුය: ගැටුම්වල නිරතව සිටින කණ්ඩායම් තුළ සහ ඒවා අතර තිබෙන සාංස්කෘතික වෙනස්කම් හඳුනා ගැනීම සහ මෙම වෙනස්කම් බලය හා සම්බන්ධ වන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට උත්සාහ දැරීම ද අවශ්‍යය.

- **සංස්කෘතික වෙනස්කම් හඳුනා ගැන්ම:** බැහැරින් මැදිහත්වන සහ ගැටුමට සම්බන්ධ වී සිටින අය අතර, තිබීමට ඉඩ ඇති සංස්කෘතික වෙනස්කම් හඳුනා ගැනීම සහ එම වෙනස්කම්වලින් ගම්‍ය වන දේ ගවේෂණය කිරීම. එහිදී සම්බන්ධ වී සිටින මිනිස් ප්‍රජාවට ගෞරවණීය වන්නේ කුමක්ද යන්න සහ ගැටුම පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා අවශ්‍ය වන්නේ කුමක්ද යන්න ගැන ද සැලකිලිමත් වනවා ඇත.

- **ගැටුමක් කාන්තාවන් කෙරෙහි බලපාන ආකාරය සහ ඒ හේතු කොට ගෙන ගැටුම කෙරෙහි ඇතිවන බලපෑම ගැන පැහැදිලි අවධානයක් යොමු කිරීම:** කෙටි කාලීන සහ දීර්ඝකාලීන යන දෙයාකාරයෙන්ම කාන්තාවන් බලගැන්වීම සඳහා දායකවීමට ඇති හැකියාව සලකා බැලීම; මෙය ඕනෑම මැදිහත්වීමකට අදාළ වේ; යෝග්‍ය වන පරිදි පර්යන්ත කණ්ඩායම් සමග කටයුතු කිරීමට ඇති හැකියාව සොයා බැලීම.

- **ගැටුමේදී බල අසමමිතිවල කාර්යභාරය ගැන පැහැදිලි අවධානයක් යොමු කිරීම:** මෙයට අදාළ වන කරුණු වන්නේ පාර්ශවයන් මගින් මේවා ප්‍රයෝජනයට ගැනීම සහ අත්විඳීමයි. එසේ කරනු ලබන්නේ ගැටුම් ව්‍යාවර්තනයට සහයෝගය දැක්වීමක් වශයෙන් ඵලදායී ක්‍රියා සඳහා මනාව දැනුවත් කරන ලද තීරණ ගැනීම පිණිසය.

- **යෝජනා කරන ලද ක්‍රියා මාර්ගය හේතුකොට ගෙන වෙනස් බල ගතිකයන් සම්බන්ධයෙන් ඇති වීමට ඉඩ ඇති බලපෑම තක්සේරු කිරීම සහ තමන් සතු බලයේ සහ වගකීමේ වපසරිය යන සීමාවන් පිළිබඳ අවබෝධයෙන් සිටීම:** සංස්කෘතිය/ බලය පිළිබඳ සංජානනය සහ භාෂාව පිළිබඳ හැකියාවන් ගැන සංවේදීතාවක් ඇති කර ගෙන සිටීම; ආධිපත්‍යය පවත්වාගැනීම සඳහා භාෂාව (නොදැනුවත්කමින් හෝ) පාවිච්චි නොකිරීම; සහකරුවන් සහ පැහැදිලි ගිවිසුම් ඇති කර ගැනීම සහ අගයන් සහ ඉලක්ක ගැන විවෘතව සිටීම.

- **අර්ථදායී කාර්යභාරයන්හි සම්පූර්ණ පරාසය සැලකිල්ලට ගැනීම:** ඒවා අතුරෙන් ක්‍රියාත්මක කිරීමට හැකි සහ ඒවා කුමන පාර්ශවයන් වෙනුවෙන් යෝග්‍ය වන්නේ ද යන්න ගැන පැහැදිලි සහ විවෘත තෝරාගැනීමක් කළ යුතු වේ. එම පාර්ශවයන් වන්නේ පක්ෂපාතී, අර්ධ පක්ෂපාතී/ සන්ධාන ගොඩනගන, පක්ෂයක් නොගන්නා (පහසුකම් සලසන / ක්‍රියාවලීන්ට සහ ධාරිතාවන්ට සහයෝගය දක්වන) කොටස්ය. ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන්ට

වඩා තුන්වන පාර්ශ්වයන් එතරම් වැදගත් නොවන බව (හෝ එසේ විය යුතු බව) මතකයේ තබාගනිමින්, බලය ආරෝපණය කිරීම සඳහා ක්‍රියා කිරීමට වඩා 'බලය සඳහා සහ සමග' යන ප්‍රතිපත්තිය පරිදි ක්‍රියා කිරීම.

- **තමන්ගේම පෞද්ගලික / සංවිධාන අවශ්‍යතා හෝ බලයට ඇති ආශාව හේතු කොට ගෙන ඇතිවන පෙළඹවීම් ගැන පරික්ෂාකාරී වීම;** යෝජිත ක්‍රියා මාර්ගය ඇත්ත වශයෙන් ප්‍රයෝජනවත් දෙයක් වන්නේද, එමෙන්ම එය ක්‍රියාත්මක කිරීමට වැඩිම හැකියාව ඇත්තේ කාටද යන්න ප්‍රශ්න කිරීම. පුද්ගල සහ සංවිධාන පිළිබඳ තිබිය යුතු ස්වයං අවබෝධය ශක්තිමත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයට පුහුණුව ලබාදීම සහ උභතෝකෝටික තත්ත්වයන් සහ පරස්පරතාවන් සමග අසීරුවෙන් හෝ කටයුතු කිරීමඃ ප්‍රතිපෝෂණය, අධීක්ෂණය, ප්‍රත්‍යාවේක්ෂණය, ඇගැයීම සහ අවශ්‍ය පරදි නැවත සකස් කිරීම අභ්‍යාසයන්ගේ සියලු අංශවලට අදාළ වන පරිදි ක්‍රියාවලි ගොඩනැගීම.

## 5. පවතින ප්‍රශ්න සහ සාපේක්ෂ අදහස්

ගැටුම් ව්‍යාවර්තනය වෙනුවෙන් කටයුතු කරන අය නිරන්තරයෙන් මුහුණපාන කරුණ වන්නේ තමන් වැළඳගත් න්‍යායයන් සහ අගයන් සමග වර්තමාන යථාර්ථයන් අනුගත වන්නේ ව්‍යතිරේක වශයෙන් පමණක් බවයි. වර්තමාන ගෝලීය බල සංස්කෘතිය, බල සම්බන්ධතා පිළිබඳ පුළුල් යථාර්ථයන් සහ පවත්නා ගැටුමට බලපාන විනාශකාරී ප්‍රවේශයන් ගැටුම් ව්‍යාවර්තන ව්‍යාපෘතිය සුළු වශයෙන් හෝ මුග්ධ ප්‍රයත්නයකට වඩා වූ බවට පත්කරයි. කෙසේ වුවද ව්‍යාවර්තනය කිරීමට දෙයක් නොමැති නම් ව්‍යාවර්තනය යන මතයට අර්ථයක් නැතිවන්නට ඉඩ තිබුණි. අභියෝගයේ හරය වන්නේ මහා පරිමාණ වශයෙන් සතුරු වූ (වෙනස්වෙමින් පැවතිය ද) පරිසරයක පෙරමුණු කීපයකින් එකවර ඉදිරියට යාම සඳහා කෙටිකාලීන සහ දීර්ඝ කාලීන පරමාර්ථයක් යන දෙකොට්ඨාසයම එක්වර එකට තබා ගැනීමට වෙර දරමින් තරගකාරී ලාභ ප්‍රයෝජන තුලනය කිරීමේ අවශ්‍යතාවයි. වාසනාවකට මෙන් ගැටුම් ව්‍යාවර්තනය සඳහා වූ ව්‍යාපෘතියට දායක වීමට කැපවී සිටින පුද්ගලයන් සහ සංවිධාන මුහුණ දීමට ඇති ප්‍රශ්න හා සමානව සංඛ්‍යාවෙන් අධික වනවා මෙන් ම විවිධ ද වේ. ඔවුන්ට වෙනස් වූ ප්‍රමුඛතා සහ දක්ෂතා ඇති අතර සමාජ දේශපාලන පිරමිඩයේ වෙන් වූ තලයන්හි දී ක්‍රියාත්මක වේ (ලෙඩෙරාච් 1995). කෙසේ වුවද සමස්ත මෙහෙයුමේ විශාලත්වය සලකා බලන කල ලෝකයේ විවිධ ප්‍රදේශවල විනාශකාරී යුද්ධ පවතින කාලයක අධෛර්යමත්වීම පහසුය. ක්ෂණික වෙනස්කම් සිදුවන කාලයක බොහෝ දෙනෙකුට, සංස්කෘතිය ඉතා දැඩි ලෙස ඕනෑ කරන අනන්‍යතාව සඳහා වන මෙවලමක් බවට පත්වී තිබේ. ඒ අතරම එය අසාධාරණය සහ කෘෘරත්වය වසා ගැනීම සඳහාත් ප්‍රචණ්ඩත්වය යුක්ති යුක්ත කිරීම සඳහාත් ප්‍රයෝජනයට ගනු ලැබේ. තවදුරටත්, අපගේ න්‍යායයන් ඒවා බලාපොරොත්තු නොවූ පරිදි අවස්ථා නම් වූ බඩ වැටි දිගේ ඇදගෙන යාමට සිදුවෙයි. ප්‍රායෝගික වශයෙන් ගත් කල සාමාන්‍ය පරිදි ගැටුම් මධ්‍යයේ කටයුතු කිරීම සඳහා වූ මාර්ග ගැටුම් ව්‍යාවර්තනය මගින්ම සොයාගත යුතුය (නැතහොත් වඩාත් අයහපත්ය).

අප විසින් ක්‍රියාත්මකවීමට සූදානම් වන කාර්යයේ ප්‍රමාණය සහ සංකීර්ණතාව ගැන කටයුතු කිරීමට උපකාරී විය හැකි එක් දෙයක් වනුයේ විපාකයන් පාලනය කළ හැකිය යන මිථ්‍යාවෙන් බැහැර වී අවසාන විග්‍රහයේ දී මාර්ග සහ ප්‍රතිඵල වෙන් කළ නොහැකි බව හඳුනා ගෙන ක්‍රියාවලියෙහි සහභාගීත්වය පමණක් සුදුසු බව පිළිගැනීමයි. සැලසුම් කිරීමේ දී සහ ඇගැයීමේ දී දැඩි ප්‍රවේශයන් අනුගමනය කළ යුතු බව කියා සිටීම, ප්‍රතිඵල අනුමත කිරීම සහ ඒවා සම්පූර්ණ වශයෙන් භාවිකථනය කිරීමට හෝ තක්සේරු කිරීමට නොහැකි බව පිළිගැනීමට ඇති අකමැත්ත, පාලනය පිළිබඳ සංස්කෘතියේ කොටසකි. මෙය වර්තමානයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජ භාවයේ නිර්මාණය අනුව පුරුෂ කොටසට අයත් වේ (බෙලෙන්කි 1986). මෙය අතිශයින් බටහිරවාදී වන්නේය. විශ්ලේෂණය සහ උපක්‍රමශීලී සැලසුම්කරණය හරහා අභිප්‍රායේ පැහැදිලි බව වැදගත්වන අතර, ඒවා නම්‍යශීලීත්වය, ප්‍රතිචාර දැක්වීම සහ සහජ ඥානය තුළින් ද (එය මා කිව යුතුද?) ඌන පූරණය කළ යුතු වේ. තක්සේරුවට ඇතුළත් විය යුතු දේ වන්නේ මුලදී සැලසුම් කරන ලද දේ සම්බන්ධයෙන් කරන ලද වෙනස් කිරීම් පිළිබඳ ඇගැයීමක් සහ බලාපොරොත්තු වූ දේවලට නියමාකාරයෙන් නොගැලපෙන ප්‍රතිපල, ගැනයි. ප්‍රතිඵල බලාපොරොත්තු සුන්කරන සහ පුදුමඑළවනසුලු වුවද එයටම ආවේණික වූ ගුණාත්මකභාවය සහ සාධාරණත්වය පදනම් කරගෙන වැඩකටයුතු ඇගැයීම කළ යුතු වේ. එය අවශ්‍යයෙන්ම පිළිගත යුතු කරුණක් වන්නේ දීර්ඝ කාලීන බලපෑම සමහරවිට කවරදාවත් දැනගත නොහැකි බවයි. අරමුදල් සපයනු ලබන නියෝජිතායතන පනවන කොන්දේසි අනුව ඔවුන් විසින් සපයනු ලබන අරමුදල් යහපත් ප්‍රතිඵල ලැබෙන පරිදි යෙදවිය යුතු බවට සහ එම සාර්ථකත්වය ගැන තීරණය කිරීම සඳහා ඔවුන් උපයෝගී කරගන්නා මිනුම් දඬු අනුව මෙම ඉල්ලීම ඉටු කිරීම අපහසු කාර්යයක් වනු ඇත (ගැටුම් ව්‍යාවර්තන කටයුතුවල නියැලී සිටින සංවිධාන සහ අරමුදල් සපයන නියෝජිතායතනය අතර තිබෙන බල සම්බන්ධතා අධ්‍යයන කාර්යය මෙන්ම ප්‍රත්‍යාවේක්ෂණය සඳහා සිත්ගන්නාසුලු ක්ෂේත්‍රයක් වනු ඇත). කෙසේ වුවද, දීර්ඝ කාලීන සහ පැතිරී ගිය ප්‍රතිඵල වෙනුවට සැපයීමට දුෂ්කර හදිසි සාක්ෂි ඉල්ලා සිටීම මගින් අප මත ආධිපත්‍යය පැතිරීමට අප ඉඩ දෙන්නේ නම් වංකභාවයට, මිථ්‍යාවට සහ කලකිරීමේ තත්ත්වයකට යාමේ අනතුරට අප මුහුණ පාන බව මම විශ්වාස කරමි.

පුළුල් පරිමාණ සහ දීර්ඝකාලීන ගැටුම් ව්‍යාවර්තනයට සංස්කෘතිය සහ ව්‍යුහාත්මක සම්බන්ධතාවන් ව්‍යාවර්තනය කිරීම ඇතුළත් වේ. සමානාත්මතාව සහ සහයෝගීතාව උපයෝගී කරගනිමින් අප ආධිපත්‍යය පතුරුවන ක්‍රම වෙනස් කරන්නේ නම්, එම වෙනස්කම් ඇති කිරීමේ දී සියලු ආකාර වූ පුද්ගලයන්ගේ සහභාගීත්වය අපට අවශ්‍ය වේ: ඒ අය කාන්තාවන්, පුරුෂයින් ඇතුළු සියලු සංස්කෘතික පසුබිම්වලට අයත් වූවෝ වෙති. යුක්තිය සඳහා එය අවශ්‍ය වන නමුත් සියල්ලන්ගේම සහභාගීත්වය දායකත්වය නොමැතිව ප්‍රමාණවත් සහ සමස්තයක ලා සැලකිය හැකි ක්‍රියාවලියක් පැවැති නොහැකිය. පවතින යථාර්යන් තුළ අප ක්‍රියා කළ යුතුයි. ඒ අතරම ගැටුම් ව්‍යාවර්තනය හඟවනු ලබන යුක්තියේ සහ ගෞරවයේ අගයන් හා බැඳී සිටීමේදී විවෘත සහ නොසෙල්වෙනසුලු විය යුතුය. අපගේම අභ්‍යන්තර වෙනස්කම් සහ බෙදීම්වලට මුහුණදීම සඳහා අප අරගලයක යෙදෙන විට දී සහ විවිධ ලෝක මතයන් සමග සංවාදයක යෙදීමට මාර්ග සොයා යද්දී අප ද ගැටුමට අනුගත වනවා ඇත - එහෙත් ගැටුම අපගේ වගකීම වන්නේය.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියැවීම් සඳහා


Alexander, Titus 1996. *Unraveling Global Apartheid: An Overview of World Politics*, Cambridge: Polity Press.

Belenky, Mary Field, et al 1986. *Women's Ways of Knowing: The Development of Self, Voice and Mind*, New York, NY: Basic Books.

Boulding, Kenneth 1978. *Ecodynamics,* London: Sage.

Burton, John (ed.) 1990. *Conflict: Human Needs Theory*, London: Macmillan.

Curle, Adam 1971. *Making Peace*, London: Tavistock Publications.

Dworkin, Andrea 2000. *Scapegoat: The Jews, Israel And Women's Liberation*, London: Virago.

Eisler, Riane 1990. *The Chalice and the Blade: Our History, Our Future*, London: Unwin Paperbacks.

Francis, Becky 2000. *Boys, Girls and Achievement*, London: Routledge.

Freire, Paulo 1972. *Pedagogy of the Oppressed*, London: Penguin.

Galtung, Johan 1990. "Cultural Violence," *Journal of Peace Research* 27, 3, 291-305.

Gutmann, Amy (ed.) 1994. *Multiculturalism*, Princeton, NJ: Princeton University Press.

King, Martin Luther 1963. *Why We Can't Wait*, New York, NY: New American Library.

Lederach, John Paul 1995. *Preparing for Peace: Conflict Transformation Across Cultures*, New York, NY: Syracuse University Press.

Max-Neef, Manfred 1985. "Reflections on a Paradigm Shift in Economics," in *The New Economic Agenda*, Inverness: Findhorn Press.

Reimann, Cordula 1999 (unpublished). *Towards Gender Mainstreaming in Crisis Prevention and Conflict Management: Guiding points for the German Development Cooperation Agency.*

Saghal, Gita and Nira Yuval-Davis (eds.) 1992. *Refusing Holy Orders: Women and Fudamentalism in Britain*, London: Virago Press.

Said, Edward 1978. *Orientalism*, London: Routledge and Keyan Paul.

Salem, Paul 1993. "In Theory: a Critique of Conflict Resolution from a Non-Western Perspective," *Negotiation Journal IX*, 4, 361 - 369.

Taylor, Charles 1994. "The Politics of Recognition," *in* Gutmann, op. cit., 25-74.